වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2017



උවව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகம்
**UVA WELLASSA UNIVERSITY**

Uva Wellassa University
Badulla, 90000

## දැක්ම

ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම

## මෙහෙවර

ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම කෙරෙහි ශක්තිමත් අවධාරණයක් සහිතව ඉගැන්වීමෙහි, ඉගෙනීමෙහි හා පර්යේෂණයෙහි උත්කෘෂ්ඨත්වයට පත් වන අතරම, ජාතික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයන් ලබා දීම පිණිස දැනුමෙන්, කුසලතාවලින්, සාරධර්මවලින් හා ආකල්පයන් ගෙන් හෙබි බහුශෘත, රැකියා නියුක්ත කළ හැකි, තාක්ෂණතාන්ත්‍රික හා ව්‍යවසායික උපාධිධාරීන් බිහි කිරීම

Uva Wellassa University

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## උපකුලපතිතුමාගේ පණිවුඩය



*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටඨත්වයේ කේන්ද්‍රයක් වනු පිණිස වූ දැක්මක් ද සහිතව **2005**ජූනි මාසයේදී ස්ථාපිත කරන ලදී.*

*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන වැඩ සටහන් මෙරට තිරසාර සංවර්ධනය උදෙසා සුවිශේෂි දායකත්වයක් ලබා දීමට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සහිත, සෑම අතින්ම පරිපූර්ණ, රැකියාවේ යෙදවිය හැකි උපාධිධාරීන් බිහි කරනු පිණිස ඉලක්ක වී ඇත. ව්‍යවසායක විශ්වවිද්‍යාලයක් වශයෙන් අපි අපගේ උපාධිධාරීන් රැකියා සොයන්නන් ලෙසට වඩා රැකියා සපයන්නන් ලෙස කටයුතු කරනු දකිනු කැමැත්තෙමු.*

*බදුල්ල මනරම් කඳුකර ප්‍රදේශයේ මනස්කාන්ත ලෙස පැතිරුනු දර්ශන සහිත භූමියක ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටා ඇති අතර, අක්කර **64** ක භූමි භාගයක් සිසාරා පැතිර ඇත්තේය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පීඨ **4** කින් සමන්විත වන අතර එය දේශීය හා ගෝලීය අවශ්‍යතාවන් ඉටු කරන මූලික උපාධි වැඩසටහන් **13** ක් ඉදිරිපත් කරයි.*

*අපි අපව,ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා කාර්යය මණ්ඩලය,ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය පවුල ලෙස සලකන්නෙමු. ගරු කිරීම හා ඉවසීම, අභිමතාර්ථ දිශාභිමුඛ වීම, සමාන ඉඩප්‍රස්ථා, විනය හා ව්‍යවසායකත්වය අප පවුලේ කේන්ද්‍රීය සාරධර්ම වන්නේය.*

*ගෙවුනු කෙටි කාල පරිච්ඡේදය තුළ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල උපාධිධාරීන් සුවිශේෂී ගුණාත්මක තත්ත්වයක සිටින බව සනාථ කර ඇති අතර,අප උපාධිධාරීන්ගේ ඉහළ රැකියා නියුක්තිය ඒ සඳහා ඇති පැහැදිලිම සාක්ෂ්‍යය වන්නේය.*

*ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සියලු දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වන විශිෂ්ටත්වයේ කේන්ද්‍රයක් වනු ඇති අතර, එය සේව්‍යයින්ට ප්‍රසාද ජනක වන සේවකයින් වනු පමණක් නොව, තමන්ද සේව්‍යයින් බවට පත් වන උපාධිධාරීන් බිහි කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත්තේය.*

*ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර*

# පටුන


දැක්ම ........................................ i

මෙහෙවර ........................................ i

උපකුලපතිතුමාගේ පණිවුඩය ........................................ ii

**1 උපකුලපතිතුමාගේ සමාලෝචනය ........................................ 4**

1.1 කෙටි හැඳින්වීම ........................................ 4

1.1.1 ශිෂ්‍ය ප්‍රජාව පිළිබඳ විස්තර ........................................ 4

1.1.2 අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ සටහන ........................................ 5

1.2 සාධනතා ........................................ 7

1.2.1 යටිතල පහසුකම් සංවර්ධනය ........................................ 7

1.2.2 අධ්‍යයන හා පර්යේෂණ සාධනතා ........................................ 8

1.2.2.1 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රථම ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRSUWU) 2017 ........................................ 8

1.2.2.2 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 7 වැනි පොදු උපාධි ප්‍රදානෝත්සවය ....... 8

1.2.2.3 විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ........................................ 8

1.2.2.4 වඩාත් කැපී පෙනෙන තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපති සම්මානය 9

1.2.2.5 තායිලන්තයේ බැංකොක්හි ජාත්‍යන්තර විද්‍යා සම්මේලනයේ විශිෂ්ටතම නිබන්ධය සම්මානය ........................................ 9

1.2.3 ශිෂ්‍ය සාධනතා ........................................ 9

1.2.3.1 IIUPST හිදී විශිෂ්ටතම සමුළු නිබන්ධය - 2017 ........................................ 9

1.2.3.2 ජාතික විශිෂ්ටතම ගුණාත්මක තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද සම්මාන - 2017 ........................................ 9

1.2.3.3 බිස්වාමිල් 2017 - ජාත්‍යන්තර සංස්කෘතික සැණකෙලිය ........................................ 10

1.2.3.4 තොරතුරු සුරක්ෂිතතා පැන තරගය - 2017 ........................................ 10

1.2.3.5 ''කෝඩ් කොම්බැට්'' (කේත සටන) - අයි.ඊ.ඊ.ඊ 20 වැනි සංවත්සරික හැකතන් තරගාවලිය ........................................ 10

1.2.4 ජාත්‍යන්තර සහයෝගිත්වයන් ........................................ 10

1.2.4.1 දකුණු කොරියාවේ චුංනාම් ජාතික විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉඩ ප්‍රස්ථා ........................................ 10

| | | |
|---|---|---|
| 1.2.4.2 | මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ දූත පිරිස ..................................... | 11 |
| 1.2.4.3 | දැනුම ප්‍රචලිත කිරීම තාක්ෂණවේදය පිළිබඳ ටෝකියෝ ආයතනය ............ | 11 |
| 1.2.4.5 | විවෘත හා දුරස්ථ ඉගෙනීම සඳහා වූ මධ්‍යස්ථානය (CODL) ..................... | 11 |
| 1.2.5.1 | බාහිර උපාධි වැඩසටහන් ................................................................. | 11 |
| 1.2.5.2 | සහතික පත්‍ර මට්ටමේ වැඩසටහන් ...................................................... | 11 |
| 1.2.5.3 | වෙනත් වැඩසටහන් ........................................................................... | 12 |
| 1.2.6 | පුස්තකාලය ........................................................................................ | 12 |
| 1.2.6.1 | 2017 වර්ෂයේ පුස්තකාල ග්‍රන්ථ මිලට ගැනීම් ....................................... | 12 |
| 1.2.6.2 | 2017 වර්ෂය තුළ පුස්තකාලය භාවිතා කළ අයුරු ................................. | 13 |
| 1.2.7 | සාම්ප්‍රදායික හා සංස්කෘතික අවස්ථා .................................................. | 13 |
| 1.2.7.1 | වෙල්ලස්ස කෝණ මංගල්‍යය ............................................................ | 13 |
| 1.2.7.2 | අළුත් අවුරුදු උත්සවය ...................................................................... | 13 |
| 1.2.7.3 | නමුනුකුල වෙසක් සඳ ......................................................................... | 13 |
| 1.2.7.4 | මලෙයිතෙන්ඩ්‍රල් ................................................................................ | 14 |
| 1.2.7.5 | ගැලේනා ............................................................................................ | 14 |
| 1.2.7.6 | ඕරෝරා 2017 ..................................................................................... | 14 |
| 1.2.7.7 | නිද්‍රා 2017 සංගීත රාත්‍රිය ..................................................................... | 14 |
| 1.2.7.8 | වර්ෂා 2017 ....................................................................................... | 14 |
| 1.2.7.9 | භාව සංකලන 2017 .............................................................................. | 15 |
| 1.2.7.10 | ග්ලැමරෝ 2017 .................................................................................. | 15 |
| 1.2.8 | ප්‍රජා බැහැර - අවතීර්ණ වැඩසටහන් .................................................. | 15 |
| 1.2.8.1 | නිරුදකයට දිය පොදක් 2017 ............................................................ | 15 |
| 1.2.8.2 | පරිගණක විද්‍යාගාරයක් පරිත්‍යාග කිරීම ............................................... | 15 |
| 1.2.8.3 | විදු නිම්සර 2017 ............................................................................... | 16 |
| 1.2.8.4 | 'ඒ.එන්.එස්. බිලඩ් ඩ්‍රයිව් 2017' ලේ දන්දීමේ වැඩසටහන ........................ | 16 |
| 1.2.8.5 | අ.පො.ස. සාමාන්‍ය පෙළ විද්‍යා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රසායන විද්‍යා වැඩමුළුව ............................................................................. | 16 |

| | | | |
|---|---|---|---|
| | 1.2.8.6 | සාක්ෂර - 2017 ........................................................................ | 16 |
| | 1.2.8.7 | සොබා රූ - 2017 ........................................................................ | 16 |
| | 1.2.9 | ක්‍රීඩා ක්‍රියාකාරකම් ........................................................................ | 17 |
| | 1.2.9.1 | ඒ.එන්.එස්. කුසලානය 2017 - පාපන්දු තරගාවලිය ................................ | 17 |
| | 1.2.9.2 | ඊ.එන්.එම්. කුසලානය - 2017 ක්‍රිකට් තරගාවලිය .................................. | 17 |
| | 1.2.9.3 | අන්තර්-විශ්වවිද්‍යාලීය පාපන්දු ශූරතාවය 2017 .................................. | 17 |
| | 1.3 | අනාගත සැලසුම් ........................................................................ | 17 |
| **2.** | **සංවිධාන ව්‍යුහය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ..............................................** | | 19 |
| **3.** | **පාලක සභාව සහ සනාතන සභාව ..............................................................** | | 20 |
| | 3.1 | පාලක සභාව ........................................................................ | 20 |
| | 3.2 | සනාතන සභාව ........................................................................ | 21 |
| **4.** | **ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සහ මානව සම්පත් ..............................................................** | | 22 |
| | 4.1 | ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම (2017 දෙසැම්බර් 31 දිනට) ...................... | 22 |
| | 4.2 | ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා අභිනවයෙන් ඇතුළත්වීම් - දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ........................................................................ | 23 |
| | 4.3 | උපාධි ප්‍රතිදානය - 2017 ........................................................................ | 24 |
| | 4.4 | නේවාසිකාගාර ........................................................................ | 25 |
| | 4.4.1 | විශ්වවිද්‍යාලට අයත් නේවාසිකාගාර ................................................ | 25 |
| | 4.4.2 | කුලියට ගනු ලැබූ නේවාසිකාගාර ........................................................ | 25 |
| | 4.5 | ශිෂ්‍යත්ත්ව ........................................................................ | 27 |
| | 4.5.1 | 2017 වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්ත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර ........... | 27 |
| | 4.5.2 | 2017 වර්ෂයේ වෙනත් ශිෂ්‍යත්ත්ව පිළිබඳ විස්තර .................................. | 27 |
| **5.** | **මානව සම්පත් ........................................................................** | | 28 |
| | 5.1 | අධ්‍යයන කාර්ය මණ්ඩලය ........................................................ | 28 |
| | 5.2 | පරිපාලන කාර්ය මණ්ඩලය ........................................................ | 28 |
| | 5.3 | අධ්‍යයන උපකාරක කාර්ය මණ්ඩලය .................................................. | 29 |
| | 5.4 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය ........................................................ | 30 |

| | | | |
|---|---|---|---|
| | 5.5 | අනධ්‍යයන කාර්ය මණ්ඩල ව්‍යාප්තිය .................................................. | 31 |
| | 5.6 | පුස්තකාල කාර්ය මණ්ඩලය .............................................................. | 32 |
| **6.** | **පර්යේෂණය හා සංවර්ධනය ..................................................................** | | 32 |
| | 6.1 | පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන .................................................. | 32 |
| | 6.2 | වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු ................................................ | 32 |
| | 6.3 | ලැබූ සම්මාන පිළිබඳ විස්තර ........................................................... | 33 |
| **7.** | **මූල්‍ය ප්‍රකාශ ...................................................................................** | | 34 |
| | 7.1 | මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශය (2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා) ........................................................................ | 34 |
| | 7.1.1 | පුනරාවර්තන වියදම් - 2017 ............................................................ | 34 |
| | 7.1.2 | මූලධන වියදම - 2017 ...................................................................... | 35 |
| | 7.2 | ව්‍යාපෘති (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත) .................................. | 37 |
| | 7.3 | ව්‍යාපෘති වියදම (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත) .......................... | 37 |
| | 7.4 | මූල්‍ය කාර්යසාධනය - 2017 ............................................................ | 38 |
| | 7.5 | අත්පත් කර ගත් යටිතල පහසුකම් පිළිබඳ විස්තර - 2017 ..................... | 39 |
| | 7.6 | මූල්‍ය තත්ව ප්‍රකාශය (2017 දෙසැම්බර් 31 දිනට) ................................ | 41 |
| | 7.7 | වර්ෂ 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය ........................................................ | 42 |
| | 7.8 | 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ... | 43 |
| | 7.9 | 2017.12.31 දිනට ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය ............................ | 45 |
| | 7.10 | 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් ප්‍රතිපත්ති .................. | 47 |
| | 7.11 | 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශවලට සටහන් ....... | 50 |
| | 7.12 | විගණකාධිපති වාර්තාව ..................................................................... | 60 |
| | 7.13 | විගණකාධිපති වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු ........ | 79 |





යටිතල පහසුකම් සංවර්ධනය



ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රථම ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRSUWU) 2017



ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 7 වැනි පොදු උපාධි ප්‍රදානෝත්සවය



විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන

වඩාත් කැපී පෙනෙන තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපති සම්මානය





දකුණු කොරියාවේ චුංනාම් ජාතික විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉඩ ප්‍රස්ථා

මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ දූත පිරිස





නිරුදකයට දිය පොදක් 2017



'ඒ.එන්.එස්. බ්ලඩ් ඩ්‍රයිව් 2017' ලේ දන්දීමේ වැඩසටහන



ඒ.එන්.එස්. කුසලානය **2017 -** පාපන්දු තරගාවලිය






අන්තර්-විශ්වවිද්‍යාලීය පාපන්දු ශූරතාවය **2017**

# 1. උපකුලපතිතුමාගේ සමාලෝචනය

## 1.1. කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකාවේ 14 වැනි ජාතික විශ්වවිද්‍යාලය වන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය රැකියා සඳහා බඳවා ගැනීමේ නිර්ණායක හා උපාධිධාරී ප්‍රතිදානය අතර අනුකූලතා පරතරය යා කරනු පිණිස වූ අත්හදා බැලීමක් වශයෙන් 2005 ජූනි 1 වැනි දින පිහිටුවන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මෙරට රැකියා සඳහා බඳවා ගැනීමේ නිර්ණායක හා උසස් අධ්‍යාපන ප්‍රතිදානය අතර අනුකූලතා පරතරය යා කිරීමේ අරමුණ ඇතිව ස්ථාපිත කරන ලදී. ඒ අනුව මෙරට ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය ලබා දෙනු පිණිස විද්‍යාත්මක, තාක්ෂණික හා ව්‍යවසායික දැනුම භාවිතා කිරීමේ හැකියාව ඇති උපාධිධාරීන් බිහි කරනු පිණිස ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය තාක්ෂණික විශ්වවිද්‍යාලයක් ලෙසින් නිර්මාණය කරන ලදී.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය  බදුල්ල මනරම් කඳුකර ප්‍රදේශයේ මනස්කාන්ත ලෙස පැතිරුණු දර්ශනීය භූමියක පිහිටා ඇති අතර, අක්කර **64** ක භූමිභාගයක් සිසාරා පැතිර ඇත. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පීඨ **4** කින් සමන්විත වන අතර එය දේශීය හා ගෝලීය අවශ්‍යතාවන් ඉටු කරන ප්‍රථම උපාධි වැඩසටහන් **13** ක් ප්‍රදානය කරනු ලබයි.

| පීඨය | උපාධි වැඩ සටහන |
|---|---|
| සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම | සත්ත්ව විද්‍යාව<br>අපනයන කෘෂිකර්මය<br>තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම<br>ජලජ සම්පත් තාක්ෂණය<br>තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම |
| විද්‍යා හා තාක්ෂණ | විද්‍යාව හා තාක්ෂණය<br>පරිගණක විද්‍යාව හා තාක්ෂණය<br>කර්මාන්ත තොරතුරු තාක්ෂණය<br>ඛනිජ සම්පත් හා තාක්ෂණය |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය හා කළමනාකරණය<br>ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ  සිද්ධි පිළිබඳ කළමනාකරණය |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය<br>ජෛව පද්ධති තාක්ෂණය |

### 1.1.1. ශිෂ්‍ය ප්‍රජාව පිළිබඳ විස්තර

2017.12.31 දින වන විට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 2252 ක් ව පැවතුනි.




*උපාධි අපේක්ෂකයන් ගහනය*

පසුගිය උපාධිධාරී ශිෂ්‍ය කාණ්ඩ **8** ම මෙරට රැකියා අවස්ථා සඳහා ඉක්මණින් අන්තර්ග්‍රහණය කර ගන්නා ලදී. එලෙස විශ්වවිද්‍යාලය සිය උපාධිධාරීන් සඳහා ඉහළ රැකියා නියුක්ති හැකියා අනුපාතිකයක් සහිතව දීප්තිමත් අනාගතයක් සහතික කරයි.

| උපාධි වැඩසටහනේ නම | වර්ෂය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| සත්ත්ව විද්‍යාව | 28 | 29 | 36 | 50 | 35 | 42 | 31 | 62 |
| අපනයන කෘෂිකර්මය | 27 | 32 | 38 | 37 | 31 | 43 | 34 | 44 |
| තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම | - | - | 40 | 42 | 37 | 43 | 19 | 39 |
| ජලජ සම්පත් තාක්ෂණය | - | - | - | 47 | 39 | 39 | 26 | 44 |
| තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම | - | - | - | 39 | 38 | 44 | 17 | 33 |
| විද්‍යාව හා තාක්ෂණය | 32 | 38 | 38 | 35 | 41 | 35 | 51 | 52 |
| පරිගණක විද්‍යාව හා තාක්ෂණය | 31 | 36 | 43 | 39 | 40 | 42 | 68 | 50 |
| කර්මාන්ත තොරතුරු තාක්ෂණය | - | - | 41 | 40 | 43 | 40 | 31 | 52 |
| ඛනිජ සම්පත් හා තාක්ෂණය | - | - | 49 | 36 | 34 | 31 | 39 | 45 |
| ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 30 | 38 | 52 | 47 | 47 | 49 | 44 | 54 |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | - | - | - | 32 | 51 | 42 | 50 | 48 |
| **එකතුව** | **148** | **173** | **337** | **444** | **436** | **450** | **410** | **523** |

*උපාධි ප්‍රතිදානය 2010- 2017*

## 1.1.2. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ සටහන

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කළ තැන් පටන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමා විසින් කුලපතිවරුන් තිදෙනකු හා උපකුලපතිවරුන් සිව්දෙනකු පත් කර තිබේ. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන, පරිපාලන අධ්‍යයන සහයක හා අංශයන්හි විහිදුණු **289** දෙනකුගෙන් යුත් ස්ථිර කාර්ය මණ්ඩලයක් ඇත.

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩුවලින් බොහොමයක් පුරවා ඇති අතර මීළඟ වර්ෂයේ මිනිස්බල අවශ්‍යතා සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක්

කර තිබේ. **2017** වර්ෂය තුළදී සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් **5** දෙනකුද, විද්‍යා හා තාක්ෂණවේද පීඨය සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් **12** දෙනකුද, තාක්ෂණවේද අධ්‍යයන පීඨය සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් **2** දෙනකුද වශයෙන් නව අධ්‍යයන පත්කිරීම් සිදුකරන ලදී. තවද පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා නව පත්කිරීම් **8** ක් සහ පුස්තකාලය සඳහා එක් නව පත්කිරීමක්

| ප්‍රභේදය | | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය | මහාචාර්යය | - | - | - | - | 02 | 06 |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය | 10 | 13 | 21 | 38 | 45 | 51 |
| | කථිකාචාර්ය/ කථිකාචාර්යය (පරිවාස) | 75 | 78 | 66 | 63 | 69 | 78 |
| පරිපාලන කාර්යය මණ්ඩලය | | 15 | 13 | 16 | 16 | 16 | 21 |
| පුස්තකාල කාර්යය මණ්ඩලය | | 03 | 03 | 03 | 03 | 03 | 03 |
| අනධ්‍යන කාර්යය මණ්ඩලය | | 04 | 04 | 04 | 40 | 73 | 130 |

සිදුකරන ලදී.

**2017** වර්ෂයේදී පුනරාවර්තන වියදම්වල හා මූලධන වියදම්වල මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත. ඒ අනුව, සමස්ත පුනරාවර්තන වියදමෙන් **56%** ක් සේවක වැටුප් සඳහා වැය කරනු ලැබූ අතර, ඉතිරිය වෙනත් වියදම් පියවනු පිණිස වැය විය.

මූලධන වියදමෙන් 39% ක් විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සඳහා වැය වූ අතර ඉතිරිය අනෙකුත් මූලධන වියදම් සඳහා වැය විය.




*පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර*




*මූලධන වියදම් පිළිබඳ විස්තර*

## 1.2. සාධනතා

### 1.2.1. යටිතල පහසුකම් සංවර්ධනය

ව්‍යාපෘති කෙටි හැඳින්වීම - **2017** මැයි **26** වැනි දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර ඒ සඳහා මුල්ගල තැබීම **2017** ජූලි **22** වැනි දින සිදුකරන ලදී. මෙම සිව්මහල් පීඨ ගොඩනැගිල්ල, අංග සම්පූර්ණ විද්‍යාගාර **4** කින්, නවීන දේශනාගාරවලින්, සම්මන්ත්‍රණ ශාලාවකින් සහ වෙනත් බොහෝ පහසුකම්වලින් සමන්විත වනු ඇත. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු **2020** වර්ෂය වන විට සම්පූර්ණ කිරීමට නියමිතයි.

තවද, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීම - **2** අදියර යටතේ ඉතිරිව ඇති ව්‍යාපෘති කාර්යයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු පිණිස **2017** ජූලි **7** වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාවට ඇතුළත් වන ව්‍යාපෘති වනුයේ ප්‍රධාන පිවිසුම සංවර්ධනය කිරීම (රුපියල් මිලියන **36**), පුස්තකාල ගොඩනැගිල්ල (රුපියල් මිලියන **476**), ශිෂ්‍ය සුභසාධන මධ්‍යස්ථානය (රුපියල් මිලියන **108**), ශ්‍රවනාගාරය (රුපියල් මිලියන **345**), කාර්ය මණ්ඩල ඉගෙනුම් ඒකකය (රුපියල් මිලියන **185**) සහ විකල්ප ජල සැපයුම් පද්ධතිය (රුපියල් මිලියන **53**) යන මේවා ය.

## 1.2.2. අධ්‍යයන හා පර්යේෂණ සාධනතා

### 1.2.2.1. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රථම ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRSUWU) 2017

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රථම ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ''තාක්ෂණ-ව්‍යවසායික සංවර්ධනය කරා වූ ගෝලීය ප්‍රවණතා'' යන තේමාව යටතේ **2017** ජනවාරි **19 - 20** දිනවල සාර්ථකව පවත්වන ලදී. මහාචාර්ය බුද්ධි මාරඹේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් මෙම සමුළුවට සහභාගි වූ, ඕස්ට්‍රේලියාවේ මහාචාර්ය කර්ස්ටන් බෙන්කන්ඩ්‍රොෆ්, චීනයේ මහාචාර්ය වෙං ලි හා දකුණු කොරියාවේ මහාචාර්ය වියොරුන් ජෝ ප්‍රධාන කථිකයන් වූ මෙම සමුළුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඉතිහාසය තුළ කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත. **2017** ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව අනු-තේමා **17** කින් හා විෂය පථ **11** කින් සමන්විත වූ අතර එහිදී උධෘතයන් **300** ක් ඉදිරිපත් කරන ලදී. මෙම අවස්ථාව විද්‍යාඥයින්, කර්මාන්ත අංශයේ නියැලී සිටින තැනැත්තන් හා ජාත්‍යන්තර නියෝජිතයින් හට එක්සත්ව ක්ෂේත්‍ර රාශියක විද්‍යාත්මක නව්‍යකරණයන් හා ගෝලීය ප්‍රවණතා ඉදිරිපත් කරනු පිණිස වේදිකාවක් සලසා දී ඇත.

### 1.2.2.2. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 7 වැනි පොදු උපාධි ප්‍රදානෝත්සවය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ **7** වැනි පොදු උපාධි ප්‍රදානෝත්සවය **2017** අගෝස්තු **6** වැනි දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රතනපාල ධම්මරක්ඛිත අති පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමියෝ ප්‍රථම උපාධි **411** ක් ප්‍රදානය කළහ.

### 1.2.2.3. විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන

සත්ව විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානී මහාචාර්ය දිනේශ් ජයසේන, අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සමන් හේරත් සහ විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පමෝදා රත්නවීර **2015** වර්ෂය සඳහා විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති සම්මාන ලැබූහ. මෙම සම්මාන ප්‍රදානෝත්සවය **2017** නොවැම්බර් **6** වැනි දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී.

### 1.2.2.4. වඩාත් කැපී පෙනෙන තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපති සම්මානය

2015 වර්ෂයේ වඩාත් කැපී පෙනෙන තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපති සම්මානය 2017 ජනවාරි 19-20 දිනයන්හිදී පවත්වන ලද 2017 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේදී මහාචාර්ය දිනේශ් ජයසේන වෙත ප්‍රදානය කරන ලදී. 2015 වර්ෂය තුළ ඉහළම උද්ධෘත සඳහා වූ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පර්යේෂණ ප්‍රදානය ද එහිදී මහාචාර්ය ජයසේන වෙත ප්‍රදානය කරන ලදී.

### 1.2.2.5. තායිලන්තයේ බැංකොක්හි ජාත්‍යන්තර විද්‍යා සම්මේලනයේ විශිෂ්ටතම නිබන්ධය සම්මානය

2017 ඔක්තෝබර් 2 - 6 දිනවලදී තායිලන්තයේ බැංකොක් නුවර ආසියානු තාක්ෂණවේද ආයතනයේදී (AIT) පවත්වන ලද ජාත්‍යන්තර විද්‍යා සම්මේලනයේදී අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශයේ කථිකාචාර්ය (පරිවාස) ඒ.එන්.ආර්. වීරවංශ මහතා වෙත සැසියේ විශිෂ්ටතම නිබන්ධය සඳහා සම්මානය ප්‍රදානය කරන ලදී.

## 1.2.3. ශිෂ්‍ය සාධනතා

### 1.2.3.1. IIUPST හිදී විශිෂ්ටතම සමුළු නිබන්ධය - 2017

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදුව 2017 ජූලි 13 - 15 දිනයන්හිදී පවත්වන ලද බහු-අවයවික විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ තුන්වැනි දෙවාර්ෂික ජාත්‍යන්තර විද්වත් සමුළුවේ තාක්ෂණික සැසියේ වාචික ඉදිරිපත් කිරීම් අංශයෙන් විශිෂ්ටතම සමුළු නිබන්ධය සඳහා වූ සම්මානය විද්‍යා හා තාක්ෂණවේද පීඨයේ දර්ශනාධිපති උපාධි ශිෂ්‍ය කිරුෂාන්ති තංගවේල් මිය වෙත ප්‍රදානය කරන ලදී.

### 1.2.3.2. ජාතික විශිෂ්ටතම ගුණාත්මක තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද සම්මාන - 2017

පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සංවර්ධනය කරන ලද ''නමුනු ට්‍රාන්ස්ලේටර්'' නමැති රැහැන්ගත නොවන ඉංග්‍රීසි-සිංහල වදන් පරිවර්තක ව්‍යාපෘතිය සඳහා ''තෘතියික ශිෂ්‍ය ව්‍යාපෘති තාක්ෂණවේද'' ප්‍රභේදය යටතේ වූ කුසලතා සම්මානයක් 2017 ඔක්තෝබර් 6 වැනි දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පැවති ජාතික විශිෂ්ටතම ගුණාත්මක තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද සම්මාන රාත්‍රියේදී ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාව සංවිධානය කරන ලද්දේ වරලත් තොරතුරු තාක්ෂණවේද ආයතනයේ ශ්‍රී ලාංකික අංශය විසිනි.

### 1.2.3.3. බිස්වාමිල් 2017 - ජාත්‍යන්තර සංස්කෘතික සැණකෙලිය

බිස්වාමිල් 2017 වනාහි ඉන්දියාවේ සෝනිපාත් හි ජින්දාල් ජගත් විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලදුව 2017 ඔක්තෝබර් 6 - 8 දිනවල පවත්වන ලද ජාත්‍යන්තර සංස්කෘතික උළෙලක් වන අතර ශිෂ්‍ය උපදේශනඥ ජගත් කුලතිලක මහතා සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිදෙනෙක් එයට සහභාගි වූහ. මෙම උළෙලට පුළුල් පරාසයක උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ විභවයන් ප්‍රදර්ශනය කරනු පිණිස ප්‍රහර්ෂවත් සංගීත මෙහෙයුම් ශිල්පීන්ද සමගින් සාමාන්‍ය දැනුම, ගායනය, නාට්‍ය, කථිකත්වය, ඒක-පුද්ගල ඉදිරිපත් කිරීම් ඇතුළු තරග රාශියක් ඇතුළත් විය.

### 1.2.3.4. තොරතුරු සුරක්ෂිතතා පැන තරගය - 2017

ශ්‍රී ලංකා අධ්‍යාපන, පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය / පරිගණක මධ්‍යස්ථානය (CERT|CC) විසින් සංවිධානය කරන ලදුව 2017 අගෝස්තු 18 දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද 2017 තොරතුරු සුරක්ෂිතතා පැන තරගයට පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සහභාගි වූහ. ''සයිබර් ට්‍රැන්ස්'' කණ්ඩායම සිය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් 5 වන ස්ථානය ලබා ගත්හ.

### 1.2.3.5. ''කෝඩ් කොම්බැට්'' (කේත සටන) - අයි.ඊඊ.ඊ 20 වැනි සංවත්සරික හැකතන් තරගාවලිය

පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ''ට්‍රැන්ස් කෝඩර්ස්'' නමැති ශිෂ්‍ය කණ්ඩායම සිය සුවිශේෂී දක්ෂතා ප්‍රදර්ශනය කරමින් ''කෝඩ් කොම්බැට්'' (කේත සටන) - අයි.ඊඊ.ඊ 20 වැනි සංවත්සරික හැකතන් තරගාවලියේදී 2 වන ස්ථානය ලබා ගැනීමට සමත් වූහ. මෙම අවස්ථාව සීමාසහිත අයි.ඊඊ.ඊ. පර්යේෂණ හා සංවර්ධන ජාත්‍යන්තර (පෞද්ගලික) සමාගම විසින් ''සුප්‍රකට රොබෝකෝඩ් වැඩසටහන් ක්‍රීඩා පාදිකාව මත ධාවනය වන තථ්‍යාසන්න රොබෝ තාක්ෂණය'' යන තේමාව ඔස්සේ සංවිධානය කරන ලදුව 2017 ඔක්තෝබර් 28 දින කොළඹ පාක් ඉස්තාල වීදියේ 'ද ස්ටේබල්ස්' හිදී පවත්වන ලදී.

## 1.2.4. ජාත්‍යන්තර සහයෝගිත්වයන්

### 1.2.4.1. දකුණු කොරියාවේ චුංනාම් ජාතික විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉඩ ප්‍රස්ථා

2017 ජනවාරි 18 දින දකුණු කොරියාවේ චුංනාම් ජාතික විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන (CNU) පශ්චාත් උපාධි හා පශ්චාත් ආචාර්ය උපාධි ඉඩප්‍රස්ථා පිළිබඳව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කරනු පිණිස විශේෂ සැසියක් සංවිධානය කරන ලදී. චුංනාම් ජාතික විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ උප සභාපති මහාචාර්ය ජුන් හියොන් ලී එම මාතෘකාව ඔස්සේ ඉදිරිපත් කිරීමක් සිදු කළේ ය.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් **40** ට වැඩි දෙනකුට චුංනාම් ජාතික විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය සඳහා ඉල්ලුම් කිරීමේ අනාගත හැකියාවන් පිළිබඳව දැනුවත් වීමට මෙහිදි ඉඩප්‍රස්ථාව සැලසුණි.

### 1.2.4.2. මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ දූත පිරිස

මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ අයනිකවේදය සඳහා වූ මධ්‍යස්ථානයේ ප්‍රධානී මහාචාර්ය අබ්දුල් කරීම් බින් මොහම්මද් අරොෆ් **2017** මාර්තු මාසයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වෙත සපැමිණියේ ය. එතුමාගේ චාරිකාවේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හා මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලය අතර අයනික භෞතික විද්‍යාව ක්ෂේත්‍රයෙහි පර්යේෂණ සහයෝගිත්වයන් සංවර්ධනය කිරීමේ සහ ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල අන්තර් හුවමාරු වැඩසටහන් හා ඒකාබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන් ඇරඹීමේ හැකියාවන් පිළිබඳව මෙහිදි සාකච්ඡා කරන ලදී.

### 1.2.4.3. දැනුම ප්‍රචලිත කිරීම තාක්ෂණවේදය පිළිබඳ ටෝකියෝ ආයතනය

ජපානයේ තාක්ෂණවේදය පිළිබඳ ටෝකියෝ ආයතනයේ ටොමොකෝ ෆුරුහෂි මහතා, නයෝකි මහතා හා කියෝකෝ මිය යන පර්යේෂණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිදෙනා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වෙත පැමිණ අඩු වියදම් විදුලිය රහිත පරිගණකගත වැසිකිලි නාන කුටිය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළහ. කළමනාකරණ පීඨයේ හා කළමනාකරණ හා තාක්ෂණවේද පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එම සැසියට සහභාගි වූහ.

## 1.2.5. විවෘත හා දුරස්ථ ඉගෙනීම සඳහා වූ මධ්‍යස්ථානය (CODL)

### 1.2.5.1. බාහිර උපාධි වැඩසටහන්

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සනාතන සභාව තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ බී.අයි.ටී. (බාහිර) උපාධිය සඳහා වූ බාහිර උපාධි වැඩසටහන සම්බන්ධ යෝජනාව නිර්දේශ කර ඇති අතර එය බාහිර විශේෂඥයින් විසින් සමාලෝචනයට ලක් කෙරෙමින් පවතී.
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ පාලක සභාව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ බී.බී.එම්. සාමාන්‍ය (බාහිර) උපාධිය සඳහා වූ බාහිර උපාධි වැඩසටහන සම්බන්ධ යෝජනාව නිර්දේශ කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂිත ය.

### 1.2.5.2. සහතික පත්‍ර මට්ටමේ වැඩසටහන්

2017 වර්ෂය තුළ පහත සඳහන් සහතික පත්‍ර වැඩසටහන් පවත්වන ලදී:-

- පාසල් ගුරුවරුන් සඳහා ජෛව පද්ධති තාක්ෂණවේදය සහ කෘෂිකර්මය
- පාසල් ගුරුවරුන් සඳහා **6 - 11** ශ්‍රේණිවල විද්‍යාව ඉගැන්වීම
- පාසල්වලින් පිටවන්නන් සඳහා ඉංග්‍රීසි (**5** වන ශිෂ්‍ය කාණ්ඩය - සහභාගික සංඛ්‍යාව: **75** යි. **6** වන ශිෂ්‍ය කාණ්ඩය - සහභාගික සංඛ්‍යාව: **99** යි.)

- පාසල් ගුරුවරුන් සඳහා ඉතිහාසය (**4** වන ශිෂ්‍ය කාණ්ඩය - සහභාගික සංඛ්‍යාව: **50** යි.)
- වෙබ් අඩවි නිර්මාණය - **2017** (**2** වන ශිෂ්‍ය කාණ්ඩය - සහභාගික සංඛ්‍යාව: **61** යි.)
- ජාවා ව්‍යවහාරික සංවර්ධනය (**2** වන ශිෂ්‍ය කාණ්ඩය - සහභාගික සංඛ්‍යාව: **63** යි.)

### 1.2.5.3. වෙනත් වැඩසටහන්

භූගෝලීය තොරතුරු සහ සිතියම් දත්ත පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහනක් ජාත්‍යන්තර සොබාදහම හා ස්වභාවික සම්පත් සංරක්ෂණ සංගමයේ ශ්‍රී ලංකා දේශ කාර්යාලය විසින් 2017 වර්ෂයේ දෙසැම්බර් 4 - 6 දිනවල පවත්වන ලදී.

### 1.2.6. පුස්තකාලය

වත්මන් පුස්තකාල සම්පත් එකතුව පරිගණක විද්‍යාව, දර්ශනවාදය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාරික අධ්‍යයනය, කළමනාකරණය, මූල්‍යනය, සංචාරණය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිත විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණවේදය, කෘෂිකර්මය, සත්ව විද්‍යා, ජලජ රෝපණය, ධීවර කර්මාන්තය ආදී පුළුල් විෂය ක්ෂේත්‍ර ආවරණය කරන 20,000 කට අධික මුද්‍රිත හා මුද්‍රිත නොවන ද්‍රව්‍ය සංඛ්‍යාවකින් සමන්විත වෙයි. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පුස්තකාලය ග්‍රන්ථ වර්ගීකරණය කරනු පිණිස Dewey Decimal Classification system භාවිතා කරමින් පරිශීලන අංශය, බැහැර දීමේ අංශය හා විද්‍යුත් සම්පත් සේවා අංශය හරහා සේවාවන් ලබා දෙයි. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පුස්තකාලය පුස්තකාල දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය (කෝහා විවෘත මූලාශ්‍ර පද්ධතිය) ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.

සප්ත-වාර්ෂික නිවාඩු ලබා සිටින ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනි අශෝකා සිරිවර්ධන මහත්මිය 2017 අගෝස්තු 1 දින ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ විශේෂඥ උපදේශිකාවක් වශයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාලයට එක්වූවා ය.

කේ.එම්.ආර්.කේ. කුලතුංග මිය ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලය වෙතින් පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඕ.ෆිල් උපාධිය ලබා ගත්තා ය.

### 1.2.6.1. 2017 වර්ෂයේ පුස්තකාල ග්‍රන්ථ මිලට ගැනීම්



## 1.2.6.2. 2017 වර්ෂය තුළ පුස්තකාලය භාවිතා කළ අයුරු

| මාසය | බැහැර දෙන අංශය | | ස්ථිර පරිශීලන අංශය | විද්‍යුත් ලියැවිලි බෙදාහැරීමේ සේවාව | කියවීමේ අංශය | මුළු භාවිතය |
|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍ය | කාර්ය මණ්ඩල | | | | |
| ජනවාරි | 480 | 114 | 1324 | 57 | 1119 | **3131** |
| පෙබරවාරි | 1066 | 39 | 2111 | 657 | 1240 | **4829** |
| මාර්තු | 658 | 63 | 487 | 540 | 1154 | **2588** |
| අප්‍රේල් | 424 | 33 | 139 | 335 | 1999 | **2841** |
| මැයි | 319 | 81 | 245 | 276 | 3350 | **4269** |
| ජූනි | 223 | 66 | 94 | 681 | 2746 | **3815** |
| ජූලි | 379 | 73 | 248 | 125 | 940 | **1772** |
| අගෝස්තු | 982 | 77 | 334 | 218 | 2341 | **3963** |
| සැප්තැම්බර් | 781 | 49 | 209 | 103 | 2225 | **3371** |
| ඔක්තෝබර් | 503 | 69 | 157 | 133 | 2429 | **3293** |
| නොවැම්බර් | 543 | 90 | 272 | 283 | 3071 | **4282** |
| දෙසැම්බර් | 288 | 98 | 218 | 114 | 3375 | **4097** |

## 1.2.7. සාම්ප්‍රදායික හා සංස්කෘතික අවස්ථා

විවිධාකාර සංස්කෘතීන්, සම්ප්‍රදායන්, ආගම් හා උත්සවවිධි අතර සහජීවනය තහවුරු කරනු පිණිස 2017 වර්ෂය තුළ වැඩසටහන් මාලාවක් මෙහෙයවන ලදී.

### 1.2.7.1. වෙල්ලස්ස කෝණ මංගලයය

සිංහල හා දමිළ අළුත් අවුරුදු සැමරුම්වලට අනුරූපව ''වෙල්ලස්ස කෝණ මංගලයය 2017 අප්‍රේල් 22 දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදී. මෙම උත්සවය විශ්වවිද්‍යාල ප්‍රජාව අතර බහු-සංස්කෘතික සාරධර්ම හා ජනවාර්ගික සමාදානය ප්‍රවර්ධනය කරනු පිණිස ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සංවිධානය කරන ලදී.

### 1.2.7.2. අළුත් අවුරුදු උත්සවය

''අලියාට ඇස තැබීම'', කනා මුට්ටිය බිඳීම, කොට්ට පොර හා කඹ ඇදීම ආදී සාම්ප්‍රදායික තරග ඇතුළත් කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සුභසාධන සමිතිය විසින් අළුත් අවුරුදු උළෙල සංවිධානය කරන ලදී.

### 1.2.7.3. නමුනුකුල වෙසක් සඳ

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වෙසක් වැඩසටහන වන ''නමුනුකුල වෙසක් සඳ'' වැඩසටහන මැයි මාසයේදී පවත්වනු ලැබූ අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ක්‍රියාකාරකම් මාලාවක් සංවිධානය කරන ලදී.

### 1.2.7.4. මලෙයිතෙන්ඩුල්

වාර්ගික සමාදානය රකිමින්ම දක්ෂතා ප්‍රදර්ශනය කරනු පිණිස කරළියක් සපයමින් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කලාත්මක හා සංස්කෘතික ගුණාවගාව ඇති කරනු පිණිස මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. මෙම අවස්ථාව 2017 සැප්තැම්බර් 17 දින බදුල්ල 'සයිමන් පීරිස්'අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබූ අතර එයට සාම්ප්‍රදායික හා සංස්කෘතික රංගදැක්වීම්, ''මලෙයිතෙන්ඩුල්'' ග්‍රන්ථය ප්‍රකාශයට පත්කිරීම සහ ''මලෙයිතෙන්ඩුල්'' ගීතය දොරටු වැඩීම ඇතුළත් විය.

### 1.2.7.5. ගැලේනා

මෙම අවස්ථාව ආහාර පාන සම්පාදන, ප්‍රියසම්භාෂණ කළමනාකරණය හා උත්සව අවස්ථා කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දීමේ ප්‍රමුඛ අරමුණ ඇතිව 2017 අප්‍රේල් 27 වැනි දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. ''ගැලේනා 2017'' හි තේමාව වූයේ ''යවන දෙව්ලොව - වළා පෙළින් ඉහළ සිට අනුභව කරමු'' යන්නයි. එමගින් අමුත්තන් හට ග්‍රීක සංස්කෘතියේ අසම සූපශාස්ත්‍ර අත්දැකීමක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කෙරුණි. මෙම අවස්ථාව සත්කාරකත්ව, සංචාරක හා උත්සව අවස්ථා කළමනාකරණය පිළිබඳ බී.බී.එම්. උපාධි වැඩසටහනේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සංවිධානය කරන ලද්දේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයටත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් අමතක නොවන අත්දැකීමක් ලබා දෙමිනි.

### 1.2.7.6. ඕරෝරා 2017

මෙම වාර්ෂික ආහාර උළෙල මගින් ඌව පළාතේ පිහිටි ග්‍රාමීය පාසලකට සහාය වනු පිණිස අරමුදල් රැස්කිරීමේ පරමාර්ථයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් පිළියෙළ කරන ලද විවිධ ප්‍රණීත ආහාර එකම පියස්සක් යටට එක්ව රසවිඳීමට විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලූ සාමාජික සාමාජිකාවන්ට ඉඩප්‍රස්ථාව ඇති කරන ලදී.

### 1.2.7.7. නිද්‍රා 2017 සංගීත රාත්‍රිය

විඩාබර සිත් පිනවාලීමේ අදහස ඇතිව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය කලා සංගමය විසින් සංවිධානය කරන ලද ''නිද්‍රා 2017'' ප්‍රසංගය, 2017 සැප්තැම්බර් 15 වැනි දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම සැඳෑව කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සැබෑ උළෙලක් විය.

### 1.2.7.8. වර්ෂා 2017

දැවුණු සිත් මඳකට තෙමාලන්නට 2017 නොවැම්බර් 15 දින බදුල්ල මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේදී ''වර්ෂා 2017" වේදිකාගත කරන ලදී. මෙම වැඩසටහන ගීතවල සාහිත්‍යමය පැතිකඩ අගය කිරීමේ පරමාර්ථය ඇතිව සංවිධානය කරන ලදී. මහාචාර්ය අත්තනායක එම්. හේරත් හා ගීත රචක සුදත් ගාමිණී බණ්ඩාර මහතා යන දෙපලගේ විවරණය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දක්ෂතා සමග සංකලනය වී මෙම සැඳෑව ආනන්දමත් එකක් විය.

### 1.2.7.9. භාව සංකලන 2017

භාව සංකලන 2017 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී 2017 නොවැම්බර් 22 දින පවත්වන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මෙන්ම දෘශ්‍ය හා රංග කලා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නාට්‍ය රඟදැක්වීම් හා නැටුම්වලින් පිරි මෙම අවස්ථාව වර්ණවත් රාත්‍රියක් විය.

### 1.2.7.10. ග්ලැමරෝ 2017

ග්ලැමරෝ වනාහි පළමු වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞරුෂත්වය, ආත්ම විශ්වාසය හා ඉදිරිපත් කිරීමේ කුසලතා දියුණු කරමින් ඔවුන්ගේ සන්නිවේදන නිපුණතා නිරාවරණය කරනු පිණිස 'සන්නිවේදන නිපුණතා' පාඨමාලාවේ කොටසක් වශයෙන් වාර්ෂිකව පැවැත්වෙන විචිත්‍ර වැඩසටහනකි. ග්ලැමරෝ 2017 අවසන් රංගනය ''මිලානෝ සෙන්ට්‍රාලි" යන තේමාව ඔස්සේ 2017 නොවැම්බර් 20 දින පැවැත්වුණි. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මෙම අවස්ථාවට සහභාගි වූහ.

## 1.2.8. ප්‍රජා බැහැර-අවතීර්ණ වැඩසටහන්

### 1.2.8.1. නිරුදකයට දිය පොදක් 2017

සමාජය හරිත සංකල්පය කරා ගෙන යාමේ හා යහපත් පාරිසරික, සාමාජීය, සංස්කෘතික, සෞඛ්‍ය හා අධ්‍යාපනික අංශ හඳුන්වා දීමේ අරමුණ ඇතිව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් නිරුදකයට දිය පොදක් **2017** සංවිධානය කරන ලදී. මෙම ප්‍රජා සේවාව **2017** අගෝස්තු **26** දින බදුල්ල, පස්සර, කතරගම, දුන්හිඳ හා ඇල්ල කලාපයන්හි දී සිදු කරන ලදී. පවිත්‍ර කිරීමේ වැඩසටහනක් හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ද මෙදින පවත්වන ලදී.

### 1.2.8.2. පරිගණක විද්‍යාගාරයක් පරිත්‍යාග කිරීම

පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය **2017** මාර්තු **6** දින දඹගල්ලේ ඇල්පිටිය නවෝද්‍යා මහා විද්‍යාලයට පරිගණක විද්‍යාගාරයක් පරිත්‍යාග කරන ලදී. මෙම පරිත්‍යාගය කරන ලද්දේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ **10** වන සංවත්සර සැමරුම් සනිටුහන් කිරීමට සංවිධානය කරන ලද ක්‍රියාකාරකම් වලින් එකක් වශයෙනි. අධ්‍යයනාංශයේ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ හා කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවෝ තවත් පරිත්‍යාගීන්ද සමගින් මෙම කාර්යයට දායකත්වය සැපයූහ.

### 1.2.8.3. විදු නිම්සර 2017

විදු නිම්සර වනාහි විද්‍යා හා තාක්ෂණවේද උපාධි වැඩසටහනේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් බදුල්ල ප්‍රදේශයේ පාසල්වල අ.පො.ස. සාමාන්‍ය පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සංවිධානය කරන ලද අධ්‍යාපනික සම්මන්ත්‍රණ වැඩසටහනකි. මෙම වැඩසටහන **2017** නොවැම්බර් මාසයේදී පාසල් සිසු දරු දැරියන් **600** කට වැඩි දෙනකුගේ සහභාගිත්වය ඇතිව විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී සාර්ථක ලෙස පවත්වන ලදී.

### 1.2.8.4. 'ඊ.එන්.එස්. බිලඩ් ඩුයිව් 2017' ලේ දන්දීමේ වැඩසටහන

සත්ව විද්‍යා උපාධි වැඩසටහනේ **3** වන වසර උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී 'ඊ.එන්.එස්. බිලඩ් ඩුයිව් **2017**' වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන **2017** ඔක්තෝබර් **19** දින සංවිධානය කළහ.

### 1.2.8.5. අ.පො.ස. සාමාන්‍ය පෙළ විද්‍යා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රසායන විද්‍යා වැඩමුළුව

බදුල්ල දිස්ත්‍රික්කයේ වරප්‍රසාද නොලත් පාසල්වල අ.පො.ස. සාමාන්‍ය පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා දෙදින වැඩමුළුවක් **2017** ජූලි **19 - 20** දිනවල ප්‍රධාන රසායන විද්‍යාගාරයේදී පවත්වන ලදී. ගාවෙල විද්‍යාලයේ හා අත්තලගෙදර තක්ෂිලා මහා විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාව **57** දෙනෙක් හා ගුරුවරුන් තිදෙනෙක් මෙම වැඩමුළුවට සහභාගි වූහ. මෙම ක්‍රියාකාරකම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය තුසිතා ඇටම්පාවල විසින් තවත් කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේද උපකාර ඇතිව සංවිධානය කරන ලදී.

### 1.2.8.6. සාක්ෂරා 2017

සත්ව විද්‍යා සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම්වලින් එකක් ලෙස සාක්ෂර **2017** වාර්ෂික වැඩසටහන බදුල්ලේ මාලංගමුව විද්‍යාදීප ප්‍රාථමික විද්‍යාලයේදී **2017** නොවැම්බර් **21** දින **3** වන වරටත් මෙහෙයවන ලදී. සාක්ෂර **2017** වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වූයේ අවශ්‍යතා ඇති පාසලකට හා එහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපකාර කොට, ඔවුන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය දේ ලබා දී ඔවුන් හොඳින් ඉගෙනීමට දිරිගැන්වීමයි.

### 1.2.8.7. සොබා රූ 2017

සත්කාරකත්ව, සංචාරක හා උත්සව අවස්ථා කළමනාකරණය පිළිබඳ බී.බී.එම්. උපාධි වැඩසටහනේ පළමු වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ''පරිසර සංරක්ෂණය හා තිරසාර සංචරණය සඳහා නායකත්වය'' පිළිබඳව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කරනු පිණිස **2017** නොවැම්බර් **20** දින සොබා රූ **2017** සංවිධානය කරන ලද අතර, ඉන් අනතුරුව බෝගොඩ පාලම වෙත චාරිකාවක්ද සිදුකරන ලදී.

## 1.2.9. ක්‍රීඩා ක්‍රියාකාරකම්

### 1.2.9.1. ඒ.එන්.එස්. කුසලානය 2017 - පාපන්දු තරගාවලිය

සත්ව විද්‍යා උපාධි වැඩසටහනේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ඒ.එන්.එස්. කුසලාන පාපන්දු තරගාවලිය **10** වන වරටත් **2017** අගෝස්තු **10** දින විශ්වවිද්‍යාලීය ක්‍රීඩාංගනයේදී පැවැත්වුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ, උපාධිධාරීන්ගේ හා උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම අවස්ථාව තරුණ හදවත්වලට ඉමහත් ප්‍රීතියක් ලබා දුණි.

### 1.2.9.2. ඊ.එන්.එම්. කුසලානය - 2017 ක්‍රිකට් තරගාවලිය

ව්‍යවසායකත්ව හා කළමනාකරණ උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ඊ.එන්.එම්. කුසලාන ක්‍රිකට් තරගාවලිය **2017** සැප්තැම්බර් **9 - 10** දිනයන්හි විශ්වවිද්‍යාලීය ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

### 1.2.9.3. අන්තර්-විශ්වවිද්‍යාලීය පාපන්දු ශූරතාවය 2017

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය **2017** සැප්තැම්බර් **22 - 24** දිනවල පැවති අන්තර්-විශ්වවිද්‍යාලීය පාපන්දු ශූරතාවය සඳහා සත්කාරකත්වය දරන ලදී .විශ්වවිද්‍යාල **13** ක් නියෝජනය කරමින් උපාධි අපේක්ෂක අපේක්ෂිකාවෝ මෙම තරගාවලියට සහභාගි වූහ. යාපනය විශ්වවිද්‍යාලය ශූරතාවය දිනා ගත් අතර අනුශූරතාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයටද, දෙවන අනුශූරතාව මොරටුව විශ්වවිද්‍යාලයටද හිමි විය.

## 1.3. අනාගත සැලසුම්

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවීම රජයේ ප්‍රයත්නයක් වන ජාතික සංවර්ධනය සඳහා ධාරිතාව ගොඩනැගීම කෙරෙහි සංකේන්ද්‍රණය වූ ඉල්ලුම්-ගාමක අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම උදෙසා ප්‍රමුඛ අත්වැලක් විය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඌව පළාතේ උපායමාර්ගික හවුල්කරුවකු වශයෙන් වූ සිය කාර්යභාරය හඳුනා ගෙන සිටින අතර එනිසාම මෙම කලාපයේ ආර්ථික වරධනය, සමාජ සංවර්ධනය හා පාරිසරික තිරසාරභාවය වෙත දායකත්වය ලබා දෙයි.

- වත්මන් උපාධි වැඩසටහන්වල බහු-විෂය ක්ෂේත්‍රීය ස්වභාවය එලෙසම පවත්වා ගැනෙනු ඇති අතර එය තවත් වර්ධනය කෙරෙනු ඇත. සිය උපාධි වැඩසටහන් ජාතික හා ජාත්‍යන්තර වෘත්තීයවේදී ආයතන වෙතින් ප්‍රතීතනය කර ගැනීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි. එයට අමතරව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය නව බහු-විෂය ක්ෂේත්‍ර පාඨමාලා හා උපාධි වැඩසටහන් හඳුන්වා දීම මගින් උසස් අධ්‍යාපනයේ නිම්වළලු පුළුල් කරනු ඇත.

- විශ්වවිද්‍යාලයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ ධාරිතාව සහිත ඉහළ සුදුසුකම් ලත් ශ්‍රම බලකාය බඳවා ගැනීම හා රඳවා ගැනීම ප්‍රමුඛත්වයක් වනු ඇත.

- විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විද්‍යාව, තාක්ෂණවේදය, කෘෂිකර්මය හා කළමනාකරණය සඳහා බහුල වශයෙන් අයදුම් කරන ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලය බවට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පත්කිරීම එහි ඉහළ අපේක්ෂණයන්ගෙන් එකකි.

- පර්යේෂණ සහයෝගිතා සහ පර්යේෂණ ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කරනු පිණිස විදේශීය පර්යේෂණ ආයතන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අදහස් කරයි.

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉගෙනුම්, ඉගෙනීම් හා පර්යේෂණ සඳහා විශිෂ්ට යටිතල පහසුකම් ඇති කර ගැනීමේ සිය අඛණ්ඩ ප්‍රයත්නයෙහි දිගටම නිරත වනු ඇත.

- කෘෂිකර්ම හා සත්ව පාලන ගොවිපල සහ මනා අංගෝපාංග සහිත ක්‍රීඩා සංකීර්ණයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ.

- නිසි උපදේශන හා මාර්ගෝපදේශන ඒකකයක් පිහිටුවීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අදහස් කරයි.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව නව නේවාසිකාගාර සංකීර්ණ සංවර්ධනය කිරීම මගින් සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නවාතැන් පහසුකම් ලබා දීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉලක්ක කරයි.

- සේවා සම්පාදකයින්ට කුඩා සමුපකාර අලෙවිසල, පොත්හල, බැංකු ශාඛාව, සුපිරි වෙළඳසල, ලොන්ඩරිය, සන්නිවේදන මධ්‍යස්ථානය, තැපැල් කාර්යාලය හා කොණ්ඩා කපන ස්ථානය වැනි සේවා ස්ථාන ඇරඹීම සඳහා පහසුකම් සැලැස්වීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අදහස් කරයි.

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය එම්බෙඩඩ් විශ්වවිද්‍යාලීය සම්පත් සැලසුම්කරණ (URP) පහසුකමක් සමගින් වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරනු ඇත.

- මේ වන විට බලන්ගොඩ වැවිලි පී.එල්.සී. සමාගම වෙතින් අක්කර **25** ක ඉඩමක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතී. තවද, මෙම විශ්වවිද්‍යාලය පුළුල් කිරීම සඳහා බලන්ගොඩ වැවිලි පී.එල්.සී. සමාගම වෙතින් අතිරේක ඉඩම් අක්කර **12** ක් අත්කර ගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යෝජනාවක් ඉදිරිපත් කර තිබේ.

# 2. සංවිධාන ව්‍යුහය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය



# 3. පාලක සභාව සහ සනාතන සභාව

## 3.1. පාලක සභාව

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වගන්තිය මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වගන්තිය ප්‍රකාරව සංස්ථාපනය කරනු ලබන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පාලක සභාව 2017 වර්ෂයේදී පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| උපකුලපතිතුමා | ආචාර්ය ජී. චන්ද්‍රසේන (2017.01.23 දින දක්වා) |
| | ආචාර්ය ජේ.එල්. රත්නසේකර (2017.02.01 දින සිට) |
| පීඨාධිපතිවරු | |
| සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය | මහාචාර්ය එස්.සී. ජයමාන්න (2017.10.31 දින දක්වා) |
| | මහාචාර්ය එස්.සී. ජයමාන්න (2017.11.01 දින සිට) |
| විද්‍යා හා තාක්ෂණවේද පීඨය | මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර (2017.05.29 දින දක්වා) - වැඩ බලන |
| | මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර (2017.05.30 දින සිට) |
| කළමනාකරණ පීඨය | ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු (2017.06.30 දින දක්වා) |
| | ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු (2017.07.01 දින සිට 2017.08.31 දින දක්වා) - වැඩ බලන |
| | ජී.එච්. අබේවීර මහතා (2017.09.01 දින සිට) |
| තාක්ෂණවේද අධ්‍යයන පීඨය | මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.05.15 දින සිට 2017.11.26 දින දක්වා) - වැඩ බලන |
| | මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.11.27 දින සිට) |
| පහත සාමාජික සාමාජිකාවන් සනාතන සභාව විසින් පාලක සභාව තුළ නියෝජනය කිරීමට පත්කරන ලදී. | |
| ජී.එච්. අබේවීර මහතා (2017.08.31 දින දක්වා) | |
| මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.05.14 දින දක්වා) | |
| මහාචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන (2017.06.23 දින සිට) | |
| ආචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල (2017.12.22 දින සිට) | |
| පහත සාමාජික සාමාජිකාවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලදී. | |
| ටී. නන්දසේන මහතා | |
| ආචාර්ය ඒ. ගුණවර්ධන | |
| ආචාර්ය ඩබ්ලියු. අබේකෝන් (2017.01.05 දින දක්වා) | |
| හේමින්ද දයාවංශ මහතා | |
| නිමල් අබේසිරි මහතා | |
| ටී.ඩී.ඒ. ජයන්ති සේනානායක මිය (2017.03.24 දින දක්වා) | |
| ආර්.එම්.පී.කේ. බණ්ඩාර රත්නායක මහතා (2017.01.18 දින දක්වා) | |
| ආරියරත්න හේවගේ මහතා (2017.07.25 දින සිට) | |
| ලේඛකාධිකාරී - පාලක සභා ලේකම් | ඒ.පී. කරුණාරත්න මහතා (2017.11.14 දින දක්වා) |
| | එම්.එෆ්. හිබතුල් කරීම් මහතා (2017.11.15 දින සිට) |

## 3.2. සනාතන සභාව

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය ප්‍රකාරව සංස්ථාපනය කරනු ලබන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සනාතන සභාව 2017 වර්ෂයේදී පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| උපකුලපතිතුමා | ආචාර්ය පී. චන්ද්‍රසේන (2017.01.23 දින දක්වා) |
| | ආචාර්ය ජේ.එල්. රත්නසේකර (2017.02.01 දින සිට) |
| පීඨාධිපතිවරු | |
| සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය | මහාචාර්ය එස්.සී. ජයමාන්න (2017.10.31 දින දක්වා) |
| | මහාචාර්ය එස්.සී. ජයමාන්න (2017.11.01 දින සිට) |
| විද්‍යා හා තාක්ෂණවේද පීඨය | මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර (2017.05.29 දින දක්වා) - වැඩ බලන |
| | මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර (2017.05.30 දින සිට) |
| කළමනාකරණ පීඨය | ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු (2017.06.30 දින දක්වා) |
| | ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු (2017.07.01 දින සිට 2017.08.31 දින දක්වා) - වැඩ බලන |
| | පී.එච්. අබේවීර මහතා (2017.09.01 දින සිට) |
| තාක්ෂණවේද අධ්‍යයන පීඨය | මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.05.15 දින සිට 2017. 11.26 දින දක්වා) - වැඩ බලන |
| | මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.11.27 දින සිට) |
| අධ්‍යයනාංශ ප්‍රධානීහු | |
| සත්ව විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන (2017.12.31 දින දක්වා) |
| අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය | ආචාර්ය පී.ඊ. කාලියදාස |
| විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය | මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.05.14 දින දක්වා) |
| | ආචාර්ය එච්.එම්.ජේ.සී. පිටවල (2017.05.15 දින සිට) |
| පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය | මහාචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර (2017.05.16 සිට 2017.05.29 දින දක්වා) |
| | ආචාර්ය එම්.එම්.එස්.එන්. ප්‍රේමතිලක (2017.05.30 දින සිට) |
| කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය | පී.එච්. අබේවීර මහතා (2017.08.31 දින දක්වා) |
| | ආචාර්ය ජේ.පී.ආර්.සී. රණසිංහ (2017.09.01 දින සිට) |
| රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය | ආචාර්ය පී.එච්.ටී. කුමාර |
| ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.බී. විජේසේකර (2017.05.16 සිට 2017.11.26 දින දක්වා) |
| | ආචාර්ය කේ.ජී.සී. සේනාරත්න (2017.11.027 දින සිට) |
| ජෛව පද්ධති තාක්ෂණික අධ්‍යයන අංශය | යූ.එම්.එන්. ජයවික්‍රම මහතා (2017.10.01 දින සිට 2017.10.31 දින දක්වා) |
| පීඨ නියෝජිතවරු | |
| සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය | ආචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න |
| | මහාචාර්ය එච්.එම්.එස්.කේ. හේරත් |
| විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය | ආචාර්ය එන්.පී. ප්‍රේමචන්ද්‍ර |
| | ආචාර්ය කේ.ඩබ්.එස්.එන්. කුමාරි |
| කළමනාකරණ පීඨය | ආචාර්ය කේ.එම්.එම්.සී.බී. කුලතුංග (2017.08.31 දින දක්වා) |
| | ආචාර්ය ජේ. සුතා (2017.02.01 දින සිට) |
| පුස්තකාලයාධිපති | කේ.එම්.ආර්.කේ. කුලතුංග මිය (2017.02.28 සිට) |
| | ඒ.එස්. සිරිවර්ධන මහත්මිය (2017.08.01 සිට) |
| ලේඛකාධිකාරී - පාලක සභා ලේකම් | ඒ.ජී. කරුණාරත්න මහතා (2017.11.14 දින දක්වා) |
| | එම්.එෆ්. හිබතුල් කරීම් මහතා (2017.11.15 දින සිට) |
| සහකාර පුස්තකාලයාධිපති | ටී. ප්‍රදීපන් මහතා (2017.03.01 සිට 2017.07.31 දින දක්වා) |

## 04. ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සහ මානව සම්පත්

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්යය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම | සත්ත්ව විද්‍යාව | 182 | 79 | 30 |
| | අපනයන කෘෂිකර්මය | 183 | | |
| | තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම | 137 | | |
| | ජලජ සම්පත් තාක්ෂණය | 172 | | |
| | තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම | 139 | | |
| විද්‍යා හා තාක්ෂණවේද | විද්‍යාව හා තාක්ෂණය | 177 | 66 | 20 |
| | පරිගණක විද්‍යාව හා තාක්ෂණය | 212 | | |
| | කර්මාන්ත තොරතුරු තාක්ෂණය | 227 | | |
| | ඛනිජ සම්පත් හා තාක්ෂණය | 181 | | |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 241 | 32 | 4 |
| | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 235 | | |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය | 81 | 15 | 6 |
| | ජෛව පද්ධති තාක්ෂණය | 85 | | |
| **එකතුව** | | **2252** | **192** | **60** |

## 4.1 ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම (2017 දෙසැම්බර් 31 දිනට)

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2017 වර්ෂයේදී යෝජිත ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන ලදි. ඒ අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තාක්ෂණවේද පීඨය යටතේ ඉදිරිපත් කරනු ලබන එක් එක් උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 60 දෙනකුද, කළමනාකරණ පීඨය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 65 දෙනකුද බඳවා ගන්නා ලදී. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කර ගෙන ඔවුන් තෝරා ගැනීම සිදු කරන ලදී.

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | මාධ්‍යය | පළමු වසර (2015/2016) | දෙවන වසර (2014/2015) | තෙවන වසර (2013/2014) | සිව්වන වසර (2012/2013) |
|---|---|---|---|---|---|---|
| සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම | සත්ත්ව විද්‍යාව | ඉංග්‍රීසි | 35 | 52 | 48 | 47 |
| | අපනයන කෘෂිකර්මය | | 42 | 53 | 49 | 39 |
| | තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම | | 29 | 36 | 36 | 36 |
| | ජලජ සම්පත් තාක්ෂණය | | 40 | 52 | 38 | 42 |
| | පාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම | | 25 | 39 | 42 | 33 |
| විද්‍යා හා තාක්ෂණවේද | විද්‍යාව හා තාක්ෂණය | | 32 | 53 | 42 | 50 |
| | පරිගණක විද්‍යාව හා තාක්ෂණය | | 58 | 55 | 50 | 49 |
| | කර්මාන්ත තොරතුරු තාක්ෂණය | | 58 | 60 | 60 | 49 |
| | ඛනිජ සම්පත් හා තාක්ෂණය | | 38 | 48 | 52 | 43 |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය හා කළමනාකරණය | | 65 | 63 | 60 | 53 |
| | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | | 64 | 62 | 61 | 48 |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය | | 81 | - | - | - |
| | ජෛව පද්ධති තාක්ෂණය | | 85 | - | - | - |
| **එකතුව** | | | **652** | **573** | **538** | **489** |

## 4.2 ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා අභිනවයෙන් ඇතුළත්වීම් - දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවෝ

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | ඇතුළත් කර ගැනීමේ වර්ෂය | ඇතුළත් කර ගැනීමට එකඟ වූ සංඛ්‍යාව | ලියාපදිංචි තථ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම | සත්ත්ව විද්‍යාව | 2015/16 | 60 | 35 |
| | අපනයන කෘෂිකර්මය | | 60 | 42 |
| | තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම | | 60 | 29 |
| | ජලජ සම්පත් තාක්ෂණය | | 60 | 40 |
| | පාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම | | 60 | 25 |
| විද්‍යා හා තාක්ෂණවේද | විද්‍යාව හා තාක්ෂණය | | 60 | 32 |
| | පරිගණක විද්‍යාව හා තාක්ෂණය | | 60 | 58 |
| | කර්මාන්ත තොරතුරු තාක්ෂණය | | 60 | 58 |
| | ඛනිජ සම්පත් හා තාක්ෂණය | | 60 | 38 |
| කළමනාකරණ | ව්‍යවසායකත්වය හා කළමනාකරණය | | 65 | 65 |

| | | | | |
|---|---|---|---|---|
| | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | | 65 | 64 |
| තාක්ෂණික අධ්‍යයන | ඉංජිනේරු තාක්ෂණය | | 86 | 81 |
| | ජෛව පද්ධති තාක්ෂණය | | 86 | 85 |
| **එකතුව** | | | **842** | **652** |

## අභිනවයෙන් ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය කාණ්ඩයේ ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය - 2017 (2015/2016 ශිෂ්‍ය කාණ්ඩය)




## 4.3 උපාධි ප්‍රතිදානය - 2017

| උපාධි පාඨමාලාව නම | වර්ෂය - 2017 (2012/2013 ශිෂ්‍ය කාණ්ඩය) | | |
|---|---|---|---|
| | **පිරිමි** | **කාන්තා** | **එකතුව** |
| සත්ත්ව විද්‍යාව | 24 | 38 | 62 |
| අපනයන කෘෂිකර්මය | 18 | 26 | 44 |
| තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම | 21 | 18 | 39 |
| ජලජ සම්පත් තාක්ෂණය | 10 | 34 | 44 |
| තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම | 12 | 21 | 33 |
| විද්‍යාව හා තාක්ෂණය | 25 | 27 | 52 |
| පරිගණක විද්‍යාව හා තාක්ෂණය | 29 | 21 | 50 |
| කර්මාන්ත තොරතුරු තාක්ෂණය | 26 | 26 | 52 |
| ඛනිජ සම්පත් හා තාක්ෂණය | 20 | 25 | 45 |
| ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 19 | 35 | 54 |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 27 | 21 | 48 |
| **එකතුව** | **231** | **292** | **523** |

## 4.4 නේවාසිකාගාර

### 4.4.1 විශ්වවිද්‍යාලට අයත් නේවාසිකාගාර

| නම | පිහිටි ස්ථානය | ධාරිතාව | | | වර්ෂයකට ශිෂ්‍ය ගාස්තුව |
|---|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | එකතුව | |
| කොරල් බියුටි | විශ්වවිද්‍යාල පරිශ්‍රය | 140 | - | 224 | 5000.00 |
| සිල්ව(ර්) ටිප්ස් | | 84 | - | | |
| බිලු සෆාය(ර්) | | - | 140 | 280 | |
| කැටිල්යා | | - | 140 | | |

### 4.4.2 කුලියට ගනු ලැබූ නේවාසිකාගාර

| පිහිටි ස්ථානය | වාර්ෂික කුලී පිරිවැය (රු.) | 2017 දෙසැම්බර් 31 දිනට නේවාසිකව සිටි සංඛ්‍යාව | | | ඒක ශිෂ්‍ය ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | එකතුව | |
| ඒ.එම්.එස්. අත්තනායක මහතා, අංක 4 ඒ, ජලටැංකිය පාර, හිඳගොඩ, බදුල්ල | 660,000 | 175 | 269 | 444 | 3500.00 |
| ඊ.එම්.එච්. ලක්මාල් මහතා, අංක 2/79, රඹුක්පොත, බදුල්ල | 288,000 | | | | |
| එම්. වීරරත්න මහතා, අංක 14/25, හංවැල්ල, බදුල්ල | 444,000 | | | | |
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවෙ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.227,574,903 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 87 (ඇ) ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.127,300,391 ක් වූ කෙරීගෙන යන වැඩ සම්බන්ධයෙන් ගිවිසුම්ගත වගීනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රදාන යටතේ මිල දී ගන්නා සියළුම ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කරන බවට ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හඳුනාගෙන තිබුණ ද ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස රු.101,410,747 ක් ගිණුම්ගත කර තිබුණ ද එය විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල, විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ සහ පුස්තකාල පොත් පරිත්‍යාග ක්‍රමක්ෂය රු.1,404,609 ක් හා රු.8,016 ක් ලෙස එකතුව රු.1,412,625 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.1,194,372 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.218,253 කින් ක්‍රමක්ෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු රු.8,483,168 ක් ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරීම වෙනුවට ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ගිවිසුම් කඩ කිරීමේ අරමුදලට බැර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු ලැබිය යුතු ශේෂයේ වැඩිවීම රු.3,322,477 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ රු.3,294,054 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.28,423 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද ඉන්ධන වියදම් දීමනා රු.122,790 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීම සඳහා විකල්ප මාර්ග සංවර්ධන අදියර II ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.1,801,476 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය යටතේ පවත්වාගෙන යන ගොවිපළේ සිටි සතුන්ගේ වටිනාකම රු.221,889 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.6,161,546 ක් වුවද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම වටිනාකම රු.6,025,451 ක් වූයෙන් රු.136,095 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ආයෝජන යටතේ දක්වා තිබුණු උපකුලපති අරමුදලේ සහ ගිවිසුම් කඩකිරීමේ අරමුදලේ ශේෂය රු.17,386,715 ක් වුව ද බැංකු ශේෂ සනාථන අනුව එම වටිනාකම රු.17,532,859 ක් වූයෙන් රු.146,144 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව, විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන තිබුණු හා විශ්ව විද්‍යාලයට ලැබී තිබුණු ස්ථාවර වත්කම්වල පිරිවැය රු.1,235,640,886 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛන අනුව එම ශේෂය රු.2,126,052,816 ක් වූයෙන් රු.890,411,930 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) වෛද්‍ය සැපයුම් | 311,274 | තොග සමීක්ෂණ වාර්තා |
| (ආ) Chemical and Glassware | 23,562,128 | තොග සමීක්ෂණ වාර්තා |
| | 23,873,402 | |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| 99 වගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයට අයිති වූ ද කවර ප්‍රභවයකින් හෝ අත්කරගනු ලැබුවා වූ ද සියලු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස විවිධ අරමුදල් යටතේ ලැබීම් ආයෝජනය කිරීම තුළින් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු පොලී ආදායම් රු.1,853,970 ක් එම අරමුදල් වලට බැර කර තිබුණු අතර ගිවිසුම් කඩකල ආචාර්යවරයෙකුගෙන් ලැබුණු රු.1,558,095 ක් ගිවිසුම් කඩකිරීමේ අරමුදලට බැර කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571 | විවිධ ඉදිකිරීම් සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී රඳවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.13,346,065 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 ජූනි 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

| | | |
|---|---|---|
| | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | • 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | • 7:2 ඡේදය | සියලුම රාජ්‍ය ව්‍යවසායයන් සතුව ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් තිබිය යුතු වුවද විශ්වවිද්‍යාලය විසින් 2018 ජූනි 30 දින වන විටත් මෙහෙයුම් අත්පොතක් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස්/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | මුල්‍ය ප්‍රකාශන අනුව, රු.64,220,660 ක් වූ පුස්තකාල පොත් සහ වාර සඟරා සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා 2018 ජූනි 30 දිනවන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 456 දෙනෙකු සඳහා 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.62,496,364 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණ ද නිලධාරීන් 454 දෙනෙකු පරීක්ෂණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය සහ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර නොගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.267,383,227 ක් ගෙවා තිබුණි. |

(උ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

---

| | |
|---|---|
| (i) 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය | ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට හිමි නිවාසවල 2014 වර්ෂයේ සිට පදිංචිව සිටින නිලධාරීන්ගෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකරගත යුතු නිවාස කුලී සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. |
| (ii) 2015 නොවැම්බර් 07 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංස්ථාපිත චක්‍රලේඛය | විශ්වවිද්‍යාල අභ්‍යන්තර විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස 03 ක් ඇතුළත නිකුත් කළයුතු වුවත් පසුගිය වර්ෂයේදී පවත්වන ලද විභාග 6 ක හා සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග 12 ක ප්‍රතිඵල නිකුත් කිරීමේදී මාස 01 සිට මාස 05 දක්වා වූ ප්‍රමාදයන් සිදුවී තිබුණි. |

(ඌ) ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/2/3/4 හා 2006 පෙබරවාරි 26 දිනැති ලිපිය සහ අංක සීඑස්ඒ/1/1/16 හා 2012 ජූනි 11 දිනැති ලිපිය

රාජකාරී කටයුතු සඳහා විදේශගතවන නිලධාරීන් විසින් අදාළ විදේශ සංචාරයෙන් ශ්‍රී ලංකා රජයට ලැබෙන ප්‍රතිලාභ ඇතුලත් වාර්තාවක් සංචාරය නිමවා දිවයිනට පැමිණ සති 2 ක් ඇතුලත ඉදිරිපත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල අරමුදලෙන් රු.3,905,523 ක් වැයකර විදේශ සංචාරවල නිරත වූ අචාර්යවරුන් 14 දෙනෙකු හා එක් නිලධාරියෙක් සහ රාජකාරී නිවාඩු මත විදේශගත වූ ආචාර්යවරු 07 දෙනෙකු විසින් අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව, අධ්‍යයන දීමනාව ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ කර නොගත යුතුය. එහෙත් එම විධිවිධානයට පටහැනිව , සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.11,625,307 ක දායක මුදල් ඉහත අරමුදලට වැඩිපුර ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.85,587,906 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.80,933,886 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,654,020 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.194,841,268 කින් වැඩි වී තිබුණ ද මුළු වියදම් රු.199,495,287 කින් වැඩිවීම නිසා පිරිහීමක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ පැවති රු.88,412,661 ක ඌනතාවය වාර්ෂිකව උච්ඡාවචනය වී තිබූ අතර 2017 "වර්ෂයේදී රු.85,587,906 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුව ද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ දායකත්වය රු.107,634,789 ක්වූ අතර එය සමාලෝචිත වර්ෂයේ දී රු.363,834,406 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

දීර්ඝ කාලයක් සේවය කළ පුහුණුවන්නන් 08 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව 2014 ජූලි 02 වැනි දින නඩුවක් පවරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය සහ සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 2016 – 2020 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම අනුව ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක 06 ක් දක්වා තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016, 2017 වර්ෂවල උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 1,490 ක් බඳවාගත යුතු වුවද, සිසුන් 1,249 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 241 දෙනෙකු අඩුවෙන් බඳවා ගැනීම තුළින් සම්පූර්ණ ධාරිතාවය උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ii) විශ්වවිද්‍යාලය විසින් 2010/2011 සහ 2011/2012 අධ්‍යයන වර්ෂ සඳහා බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 998 දෙනෙකු වූ අතර උපාධිය ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව 860 දෙනෙකු විය. ඒ අනුව උපාධිය සම්පූර්ණ කර නොගත් ශිෂ්‍ය සංඛ්‍යාව ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 14 ක් විය.

(iii) ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා, අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුළින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම අරමුණක් වී තිබුණ ද පසුගිය වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී එක් විදේශීය සිසුවෙකු බැගින් පමණක් බඳවාගෙන තිබුණි.

(iv) 2014 වර්ෂයේදී සියයට 77 ක් වූ සේවා නියුක්තිය 2017 වර්ෂයේදී 100 දක්වා වර්ධනය කර ගැනීමට ආයතනයේ අරමුණ වුවද, 2011/2012 අධ්‍යයන වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී උපාධිය ලබා පිටවූ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විශ්වවිද්‍යාලය මගින් සිදුකර තිබූ සංගණනයේ දී සේවා නියුක්තිය සියයට 62 සිට සියයට 74 දක්වා පරාසයක පැවතුනි.

(ආ) විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කමිටුව විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති 33 ක් අනුමත කර ඒ වෙනුවෙන් රු.37,520,707 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘති 21 ක් පමණක් ආරම්භ කර තිබුණු අතර ඉන් 20ක් නිමකර තිබුණි. එසේ වුවද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 56 ක් එනම් රු.21,027,409 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ඌන උපයෝජිතව පැවතුණි. කෙසේ වුවද, නිම කරන ලද ව්‍යාපෘති වාර්තා 20 පදනම් කරගෙන නව නිපැයුම් හෝ සේවා ජනිත කර ඒ සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුල දී මිලදී ගෙන තිබුණු රු.593,799 ක් වටිනා තොග අයිතම් 17 ක් කල් ඉකුත් වී තිබුණු අතර විගණිත දිනය වූ 2018 ජූනි 30 දින වන විටත් එම තොග අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළව 2008 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ ගත් තීරණය අනුව, විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු හෙක්ටයාර් 30.9667 ක ඉඩම්වල අයිතිය මෙම වාර්තාවේ දින වන විටත් විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.3,247,475 ක විදේශ ගමන් වියදම් දරා තිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් සපයා තිබුණු සිසුන් 1,849 දෙනෙකු අතුරින් සිසුන් 841 දෙනෙකු හෙවත් සියයට 46 ක් සඳහා කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සිසුන් 506 දෙනෙකුට පහසුකම් ලබාදිය හැකි නේවාසිකාගාර 04 ක් පමණක්

ස්ථාපිත කර තිබුණු අතර නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා කුලී නිවාස ලබාගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළදී රු.21,638,235 ක් වැයකර තිබුණි. ඒ අනුව, විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර 12 ක් පමණ ගත වී තිබුණ ද ස්ථිර නේවාසිකාගාර ඉදි කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී කුලී පදනම මත වාහන 14 ක් යොදාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් රු.16,601,629 ක් වැයකර තිබුණි. එසේම පසුගිය වර්ෂ 04 ක කාලයක් සඳහා කුලිය වශයෙන් රු.65,055,751 ක් ගෙවා තිබුණු අතර විශ්වවිද්‍යාලය ස්ථාපිත කර, වසර 12 ක් ගත වී ඇතත් වාර්ෂික අයවැය ලේඛන මගින් ප්‍රතිපාදන සලසා ගැනීම තුළින් අත්පිට හෝ කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධක අරමුදල යන අරමුදල්වල 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,314,079 ක ශේෂයක් වූ අතර වර්ෂය තුල කිසිදු කාර්යයක් සඳහා එම අරමුදල් උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආයතන දෙකකින් හා එක් ව්‍යාපෘතියකින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ 02 ක විවිධ වැඩසටහන් සඳහා ලැබී තිබුණු රු.1,308,853 ක මුදලින් සියයට 20 ක් ප්‍රයෝජනයට නොගෙන ඉතිරි වී තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය මගින් රු.2,043,499 ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් 2016 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටර් රථය, රෝද හතරේ ට්‍රැක්ටර් රථය සහ නගුල හා උපාංග සහ රු.6,270,760 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිල දී ගෙන තිබුණු ඉගැනුම් හා කාර්යාල උපකරණ විගණිත දිනය වන 2018 ජුනි 30 වන දින දක්වාම එම අරමුණ ඉටු කරගැනීම සඳහා භාවිතා කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ එෆ් කොටසේ වෙන් කිරීම හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ("Partition and Other Improvements to Block F" ) 2017 සැප්තැම්බර් 23 වන දින රු.16,952,719 ක ගිවිසුම්ගත මුදලකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා තිබුණු අතර විගණිත දිනය වූ 2018 මාර්තු 06 දිනට කල වැඩ වෙනුවෙන් රු.15,619,407 ක් කාර්යාංශයට ගෙවා තිබුණි. එසේ වුවද, විදුලි බල්බ සවිකරන ස්ථාන (Lamp Points) 34 ක් භාවිතයට ගැනීමට නොහැකි වන සේ සිවිලිම සවිකර තිබුණු බව 2018 මාර්තු 06 වන දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඒ අනුව ඒ සඳහා වැයකල රු.187,000 ක් නිෂ්කාර්ය ගෙවීමක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) භාණ්ඩ මිලදී ගැනීමේ දී, අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම කෙරෙහි අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් 2015 මැයි 21 දින හා සැප්තැම්බර් 11 වන දින මිලදී ගෙන තිබුණු A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි වලින් රු.653,193 ක් වටිනා ඡායා පිටපත් පැකට් 710 ක් විගණිත දිනය වූ 2018 මැයි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවතුනි.

(ඈ) තොග පාලන කටයුතු වෙනුවෙන් රු.165,000 ක් වැයකර 2016 නොවැම්බර් 24 දින මිලදී ගෙන තිබුණු පරිගණක මෘදුකාංගය 2017 දෙසැම්බර් 31 දින වන විටත් තොග පාලන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

## 4.6 ආර්ථික නොවන ගනුදෙනු

විශ්වවිද්‍යාලය කුලී පදනම මත වාහන සැපයුම්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව කුලී වාහන රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට එකඟ වී නොතිබුණ ද එම රියදුරන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් කුලී පදනම මත ලබාගත් නිවාසයක් ලබාදී ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.240,000 ක් විශ්වවිද්‍යාලයේ අරමුදල් මගින් වැයකර තිබුණි.

## 4.7 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) අධ්‍යයන කාර්යමණ්ඩලය

(i) 2006 වර්ෂයේදී 10 ක් වූ විශ්වවිද්‍යාලයේ අනුමත මහාචාර්ය තනතුරු සංඛ්‍යාව 2017 වර්ෂයේ දී 05 දෙනෙකු දක්වා අඩුකර තිබුණු අතර 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති එම තනතුරු පිරවීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ii) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු වලින් විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතින අතර අනුමත තනතුරු 275 කින් තනතුරු 83 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවතුණි.

### (ආ) පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය

(i) 2006 ජූනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 77 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති තනතුර විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතින අතර 2017 ජූලි 21 දින පැවති 123 වන පාලක සභා රැස්වීමේ අනුමැතිය මත සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති 2017 අගෝස්තු 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා රු. 150,000 ක දීමනාවක් මත පුස්තකාලාධිපති ලෙස පත්කර තිබුණි. අනතුරුව 2017 දෙසැම්බර් 22 දින පැවති 128 වන පාලක සභා රැස්වීමේ තීරණය මත අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ පුස්තකාල උපදේශක තනතුරක් සඳහා එම නිළධාරිනිය 2018 ජනවාරි 01 දින සිට රු. 225,000 ක දීමනාවක් මත පත්කර තිබුණි. ඒ අනුව පුස්තකාලාධිපති තනතුර පුරප්පාඩුව පැවතිය දී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන පුස්තකාල උපදේශක තනතුරක් සඳහා බඳවා ගෙන තිබුණි.

(iii) විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු තනතුර විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට විගණිත දිනය වූ 2018 ජූනි 30 දින දක්වා පුරප්පාඩුව පැවති අතර එම තනතුර සඳහා ඌව පළාත් සභා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා 2015 දෙසැම්බර් 02 දින සිට මාසිකව රු.50,000 ක දීමනා මත අර්ධ කාලීනව පත්කර තිබුණි.

(iv) විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂයට පෙර ට්‍රැක්ටර් 02 ක් ද 2017 වර්ෂය තුල බස්රථ 03 ක්ද මිලදී ගෙන තිබුණු නමුත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ස්ථිර රියදුරන් බඳවා ගැනීමට කටයුතු නොකර විශ්වවිද්‍යාලයේ ශ්‍රම සැපයුම් වැඩසටහන යටතේ දෛනික දීමනා මත පුද්ගලයන් හතර දෙනෙකු රියදුරන් ලෙස බඳවාගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට ආදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණ ද තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම හා තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීම සිදුකර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය හා ඊට පෙර ආරම්භකර ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.114,811,098 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 72 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට හෝ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර

නොතිබුණු අතර ඉන් රු.87,184,465 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 46 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිමකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල නිමකිරීමට සැලසුම් කර තිබුණු රු.505,000,000 ක් වටිනා ප්‍රසම්පාදන 134 කින් රු.163,506,415 ක් වටිනා ප්‍රසම්පාදන 39 ක් නිමකර නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නේවාසිකාගාර සහ කාර්යමණ්ඩල සඳහා නිවාස 75 ක් කුලියට ලබා ගැනීම වෙනුවෙන් 2016 සැප්තැම්බර් 12 දින ප්‍රසිද්ධ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමේ කොන්දේසි 2.6 ප්‍රකාරව, රජයේ ඇස්තමේන්තු තක්සේරු කුලිය හා ඉදිරිපත් වන කුලිය සලකා බලා ගෙවිය යුතු කුලිය තීරණය කල යුතු වුවත් කුලියට ලබාගත් නිවාස 13 ක් සඳහා රජයේ තක්සේරු කුලියට වඩා මාසිකව රු.112,100 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද රජයේ ඇස්තමේන්තු තක්සේරු කුලිය ලබා නොගෙන නිවාස 12 ක් වෙනුවෙන් මාසික කුලිය රු.775,070 ක් ගෙවා තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව මාසික කුලී වටිනාකම රු.681,282 ක් වන නිවාස 15 ක් 2017 වර්ෂයේ අවස්ථා කිහිපයකදී නේවාසිකාගාර ලෙස හා මාසික කුලිය රු. 47,000 ක් හා රු. 27,500 ක් බැගින් නිවාස දෙකක් සංචාරක නිවාස වෙනුවෙන් වසරක කාලයක් සඳහා කුලියට ලබාගෙන තිබුණි.

(ඇ) නේවාසිකාගාර හා නිල නිවාස සඳහා නිවාස තෝරා ගැනීමේදී එම නිවාස වලට අදාල අනුකූලතා සහතික පිළිබඳ අවධානය යොමු කර නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම සඳහා යොදාගත් නිවාසවල ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයට එකක් රු.5,400,000 බැගින් රු.10,800,000 ක් ගෙවා බස් රථ දෙකක් 2017 දෙසැම්බර් 07 දින පෞද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදනය සඳහා පිළියෙළ කළ පිරිවිතර ප්‍රකාරව 2017 වර්ෂයේ නිෂ්පාදිත බස් රථ මිලදී ගත යුතු වුවත් 2016 වර්ෂයේ නිෂ්පාදිත බස් රථ දෙකක් මිලදී ගෙන තිබුණි.

(ii) මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය පරිදි කඳු සහිත මාර්ග පද්ධතියට වඩාත් යෝග්‍ය ඇලුමිනියම් බඳ සහිත ආසන 58 ගියර් 06 ඇලුමිනියම් තට්ටුව සහිත බස් රථ කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට ෆයිබර් මිශ්‍රිත බඳ සහිත බස් රථ කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණි.

(ඉ) කාර්යමණ්ඩල නිල නිවාස සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2016 ඔක්තෝබර් 14 දින ආරම්භකර මිල ගණන් කැඳවා තිබුණද නියමිත කාල වකවානුව තුල තාක්ෂණික ඇගයීමේ කමිටුව ක්‍රියාත්මක නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.589,500 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඊ) 2006 වර්ෂයේ විශ්වවිද්‍යාලය පිහිටුවීමේ පළමු වන අදියර යටතේ රු. මිලියන 350 ක් වටිනා ගොඩනැගිලි ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0536/035 හා 2005 අප්‍රේල් 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාර නිර්මාණය කර ඉදි කිරීමේ ක්‍රමයට ඉටු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය තෝරා ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉදිකිරීම සිදු කිරීම සඳහා 2005 ජූනි 09 වන දින සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 05 කදී රු.138,217,390 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ii) 2006 අගෝස්තු 21 වන දින විශ්වවිද්‍යාලය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමග නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉදිකිරීම සිදු කිරීම සඳහා මුළු වැඩ වටිනාකම රු.284,273,405 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුමට එළඹීමට පෙර 2006 පෙබරවාරි 06 වන දින සිට 2006 මැයි 31 වන දින දක්වා අවස්ථා 05 කදී රු.84,890,797 ක් විශ්වවිද්‍යාලය මගින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණි. එසේ වුවද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයට ඉහත කොන්ත්‍රාත්තුවේ පරිපාලන කටයුතු පැවරීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) මෙම ඉදිකිරීම සඳහා 2005 අප්‍රේල් 21 දිනැති 05/ 0536/ 035අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව නිර්මාණය කර ඉදිකිරීම ක්‍රමයට කොන්ත්‍රාත් කරු සමග ගිවිසුම් ගත වී තිබියදී ඉදිකිරීම කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද CIDA/SDB/04 න් 14.1.(ආ) වගන්තිය පරිදි මිල ගැලපුම් සඳහා ගෙවීම් නොකල යුතු වුවද ඊට පටහැනි ලෙස මිල විචලනයන් ලෙස රු.28,427,341 ක් කොන්ත්‍රාත් කරු වෙත ගෙවීම් කර තිබුණි.

(iv) කොන්ත්‍රාත්කාර සමාගමෙන් ප්‍රමාද දඩ වශයෙන් රු.2,250,000 ක් අයකර ගෙන තිබුණ ද ගණනය කිරීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(v) 2006 අගෝස්තු 21 වන දින විශ්වවිද්‍යාලය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමග එළඹුණු ගිවිසුම අනුව වැඩ කොටස් 05 ක් සඳහා රු.284,273,405 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණ ද 2015 නොවැම්බර් 16 වන දින අවසාන ගෙවීම් වාර්තාවේ වැඩ කොටස් 06 ක් ඇතුළත් කර ගිවිසුම්ගත නොවූ වැඩ කොටස් සඳහා රු.44,123,115 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

### 6.3 අයවැය පාලනය

ඇස්තමේන්තුගත ආදායම්, සත්‍ය ආදායම් සමග සැසඳීමේ දී අය විෂයයන් 04 ක සියයට 15 සිට සියයට 151 දක්වා සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ අතර ඇස්තමේන්තුගත වියදම්, සත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 13 ක සියයට 20 සිට 119 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එසේම ප්‍රාග්ධන වියදම් යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද වියදම අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවන කොටස ප්‍රකාරව අපද්‍රව්‍ය මෝචනය හෝ බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂණ

බලපත්‍රයක් ලබාගෙන ඊට අදාළ කටයුතු සිදුකළ යුතු වුවත් විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර වල භාවිතා කර ඉවත් කරනු ලබන රසායන ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා එවැනි බලපත්‍රයක් ලබා ගෙන ඊට අනුකූලව කටයුතු කිරීම වෙනුවට විශ්වවිද්‍යාල භූමියේ සකස් කරන ලද වලකට ජලය සමග මිශ්‍ර කර බැහැර කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂ 03 ක ජල පරිභෝජනය වෙනුවෙන් රු.13,537,151 ක වියදමක් දරා තිබුණි. විශ්වවිද්‍යාලයේ විවිධ අංශ විසින් බැහැර කරන අපවිත්‍ර ජලය, අපජල පිරිපහදු පද්ධතිය මගින් පිරිසිදු කර බැහැර කිරීම සිදු කර තිබුණද මෙම ජලය වාහන සේදීමට හා වෙනත් නඩත්තු කටයුතු සඳහා යොදා ගෙන ජලය සඳහා වැයවන පිරිවැය අඩුකර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳූ ගිණුම් පැවතීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම, ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) ගබඩා පාලනය | දුර්වල තොග කළමනාකරණය. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

## 7.13 විගණකාධිපති වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු

**ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**02.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1.** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 | |
| (i) | ප්‍රමිතියේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.227,574,903 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමක් මේ දක්වා සිදුකොට නොමැති අතර, මෙම වර්ෂය තුල එම වත්කම් සියල්ල නැවත තක්සේරු කිරීමට (revaluation) සැලසුම් කොට ඇත. |
| (ii) | ප්‍රමිතියේ 87 (ඇ) ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.127,300,391 ක් වූ කෙරීගෙන යන වැඩ සම්බන්ධයෙන් ගිවිසුම් ගත වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල නොතිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන (ප්‍රාග්ධන) වැඩවල වටිනාකම වූ රු.127,300,391 ක් ඇතුලත් ව්‍යාපෘති පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුල සටහන් අංක 8 හි ප්‍රධාන ශීර්ෂ 3 ක් යටතේ පහත පරිදි දක්වා ඇත.<br>I) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීම.<br>II) තාක්ෂණ පීඨය ඉදිකිරීම.<br>III) පුනුරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති.<br>2016 වර්ෂය තුලදී සියලුම කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධනිත කල අතර සටහන් අංක 35 යටතේ ඒ බව දක්වා ඇත. |

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | රාජ්‍ය ප්‍රදාන යටතේ මිල දී ගන්නා සියළුම ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කරන බවට ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හඳුනාගෙන තිබුණ ද ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස රු.101,410,747 ක් ගිණුම්ගත කර තිබුණ ද එය විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ගොඩනැගිලි වල මුළු වටිනාකම ක්‍රමක්ෂය යටතේ කපාහැරීමක් නොකරන ලෙස 2013 වර්ෂයේ රජයේ විගණන අංශයේ සාමාජිකයන් සමඟ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පැවති සාකච්ඡාවකින් පසුව තීරණය කරන ලද අතර ඒ අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළියෙල කර තිබේ. ඒ අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති 4.1 යටතේ විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමට අදාල ප්‍රාග්ධන ප්‍රදාන සමුච්චිත අරමුදලට බැර කරන බව සඳහන් කර තිබේ.<br><br>එම ප්‍රතිපත්තිය යටතේ 2017 වර්ෂයේ විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමේ වියදම් වලට අදාල ප්‍රග්ධන ප්‍රදානයන් සමුච්චිත අරමුදලට බැර කරන ලදී. |
| (ආ) | පසුගිය වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ගෙවිය යුතු ගිණුම් යටතේ ප්‍රතිපාදනයන් සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල විසිළුක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ සහ පුස්තකාල පොත් පරිත්‍යාග ක්‍රමක්ෂය රු. 1,404,609 ක් හා රු. 8,016 ක් ලෙස එකතුව රු.1,412,625 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.1,194,372 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.218,253 කින් ක්‍රමක්ෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>2017 වර්ෂය සඳහා (HETC) ව්‍යාපෘතිය යටතේ ලද උපකරණවල ක්‍රමක්ෂය හා පුස්තකාල පොත් පරිත්‍යාග වල ක්‍රමක්ෂය වටිනාකම රු.1,412,625 ක් විය යුතු බව පිළිගන්නා අතර ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි. |
| (ඈ) | ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.8,483,168 ක් ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කිරීම වෙනුවට ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ගිවිසුම් කඩකිරීමේ අරමුදලට බැර කර තිබුණි. | E.K.N.D.ප්‍රනාන්දු රු.6,765,222.99<br>2018 පෙබරවාරි මාසය තුළදී රු.215,951.50 ක මුදලක් ගෙවා ඇති අතර ඉතිරි වාරික ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| | | <u>M.A.R.N.පෙරේරා රු.895,503.79</u><br><br>මෙම ආචාර්යවරයාගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගත යුතු ශේෂය මෙමඟින් නිරූපණය කෙරේ.මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති අතර ශේෂය ප්‍රේෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.<br><br><u>G.M.A.U.K.ගන්නෝරුව රු.822,441.67</u><br><br>මෙම ආචාර්යයවරයාගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගත යුතු ශේෂය මෙමඟින් නිරූපණය කෙරෙන අතර මෙම මුදල විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු ලැබිය යුතු ශේෂයේ වැඩිවීම රු.3,322,477 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ රු.3,294,054 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.28,423 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2017 වර්ෂයේදී ලැබිය යුතු ශේෂ (ජංගම) ගිණුමෙහි සිදු කරන ලද මුදල්මය නොවන ගැලපීමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ඉවත් කරන ලදි. නමුත්, ලැබිය යුතු ශේෂ (ජංගම) ගිණුමට සිදු කල යුතු එම ගැලපීම වැරදීමකින් දීර්ඝ කාලීන ලැබීම් ශේෂයට ගැලපීම් කර ඇත. |
| (ඊ) | ඉදිරියට වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද ඉන්ධන වියදම් දීමනා රු.122,790 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග සංවර්ධන අදියර II ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද රු.1,801,476 ක් මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට වියදම් ලෙස කපා හැර තිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>විශ්වවිද්‍යාලයට ප්‍රවේශ විම සඳහා විකල්ප මාර්ග සංවර්ධනය ආදියර II ව්‍යාපෘතිය සඳහා වැය කල රු.1,801,476 ක මුදල 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුල විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීම සඳහා විකල්ප මාර්ග සංවර්ධනය ආදියර I යටතේ නිමකරන ලද ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගැනිණි. ඉදිරියේදී මෙම වියදම නිවැරදි ව්‍යාපෘතිය යටතේ වර්ග කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය යටතේ පවත්වාගෙන යන ගොවිපළේ සිටි සතුන්ගේ වටිනාකම රු.221,889 ක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමග එකඟ වේ.<br><br>ඉදිරියේදී, වර්ෂය අග සිටින සතුන්ගේ වටිනාකම සටහනක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට කටයුතු කරමි. |

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව, ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.6,161,546 ක් වුව ද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම වටිනාකම රු.6,025,451 ක් වූයෙන් රු.136,095 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම නිරීක්ෂණය සමග එකඟ වේ.<br><br>මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොගයෙහි ඇතුලත් ලිපිද්‍රව්‍යවල තොග වටිනාකම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ලිපිද්‍රව්‍ය තොගය අතර වූ වෙනස දැනටමත් හඳුනාගෙන ඇති අතර,ඉදිරියේදී අදාල ගැලපීම් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ආයෝජන යටතේ දක්වා තිබුණු උපකුලපති අරමුදලේ සහ ගිවිසුම් කඩකිරීමේ අරමුදලේ ශේෂය රු. 17,386,715 ක් වුවද බැංකු ශේෂ සනාථන අනුව එම වටිනාකම රු.17,532,859 ක් වූයෙන් රු.146,144 ක පැහැදිලි නොකර වෙනසක් නිරීක්ෂණය විය. | මෙම නිරීක්ෂණය සමග එකඟ වේ.<br><br>**උපකුලපති අරමුදල**<br><br>මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 02 යටතේ දක්වා ඇති උපකුලපති අරමුදලේ ශේෂය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.<br><br>**ගිවිසුම් කඩ කිරීමේ අරමුදල**<br><br>මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 02 යටතේ දක්වා ඇති ගිවිසුම් කඩ කිරීමේ අරමුදලේ ශේෂය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.<br><br>ඉහත නිරීක්ෂණයෙහි සඳහන් රු.146,144 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල ජංගම ලැබිය යුතු ශේෂ යටතේ වූ ලැබිය යුතු පොළී ශේෂය තුල ඇතුලත් නිසා මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මූල්‍යමය වශයෙන් බලපෑමක් ඇති නොකරයි. මෙය, තොරතුරු හෙළිදරව් කිරීමේදී සිදුවූ දෝෂයක් වන අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන අනුව, විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන තිබූ හා විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු ස්ථාවර වත්කම් වල පිරිවැය රු. 1,235,640,886 ක් වුව ද ස්ථාවර වත්කම් ලේඛණ අනුව එම ශේෂය රු.2,126,052,816 ක් වූයෙන් රු.890,411,930 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණනය සඳහා දෙන ලද ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර තිබුනේ 2017 අගෝස්තු මාසය දක්වා පමණි. ඒ බව විගණන අංශය වෙතද දන්වන ලදී. කෙසේ වෙතත් මේ වන විට ස්ථාවර වත්කම් ලේඛණය 2017 දෙසැම්බර් දක්වා යාවත්කාලීන කර ඇත. මූල්‍ය ප්‍රකාශණ වාර්තාවේ හා ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් වටිනාකමේ වෙනසක් නොමැති බව දන්වමි. |

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයු විගණන සාක්ෂි | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (ආ) | වෛද්‍ය සැපයුම් | 311,274 | • තොග සමීක්ෂණ වාර්තා | තොග සමීක්ෂණය අවසන් කොට ඇති අතර, අදාල වාර්තා විගණනයට ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) | Chemical and Glassware | 23,562,128 | • තොග සමීක්ෂණ වාර්තා | |
| | එකතුව | **23,873,402** | | |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත<br><br>99 වගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයට අයිති වූද කවර ප්‍රභවයකින් හෝ අත් කර ගනු ලැබුවා වූ ද සියළු මුදල් විශ්වවිද්‍යාලයේ අරමුදලට බැර කර යුතු වුවද, ඊට පටහැනි ලෙස විවිධ අරමුදල් යටතේ ලැබීම් ආයෝජනය කිරීම තුලින් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබූ පොළී ආදායම් රු. 1,853,970 ක් එම අරමුදල් වලට බැර කර තිබුනු අතර, ගිවිසුම් කඩ කර ආචාර්යවරයෙකුගෙන් ලැබුණු රු.1,558,095 ක් ගිවිසුම් | මෙම පොළී ආදායම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතුවලින් ලද පොළී ආදායමක් නොවන අතර එක් එක් අරමුදල් පිහිටුවා ඇති අරමුණු ඉටුකරගැනීම සඳහා එම පොළී ආදායම වාර්ෂිකව අදාල අරමුදලට බැර කොට ඇත. ඒ අනුව එක් එක් තැන්පතුව වෙනුවෙන් ලද පොළී ආදායම ඒ ඒ අරමුදලට බැර කිරීමේ අරමුණු පහතින් දැක්වේ. |

| | | | |
|---|---|---|---|
| | | කඩකිරීමේ අරමුදලට බැර කිර තිබුණි. | <u>ඌව කර්මාන්ත කේන්ද්‍රය අරමුදල - 2017 වර්ෂය සඳහා පොළිය රු.323,809/-</u><br><br>ඌව කර්මාන්ත කේන්ද්‍රය ව්‍යාපෘතිය මඟින් උපයා ගන්නා ලද ආදායමින් කොටසක් වෙන්කොට මෙම තැන්පතුව පවත්වාගෙන ගොස් ඇති අතර විශ්වවිද්‍යාලයේ සුභසාධන කටයුතු වෙනුවෙන් මෙම ආයෝජන ආදායම යොදා ගැනීමට බලාපොරොත්තු වේ.<br><br><u>උපකුලපති අරමුදල - 2017 වර්ෂය සඳහා පොළිය රු.23,981/-</u><br><br>විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට ස්වයං මූල්‍යන ව්‍යාපෘති වලින් ලද ආදායමෙන් කොටසක් වෙන් කිරීමෙන් මෙම තැන්පතුව පවත්වාගෙන ගොස් ඇති අතර විශ්වවිද්‍යාලයීය කාර්යය මණ්ඩලයේ සුභසාධන කටයුතු වෙනුවෙන් මෙම පොලී ආදායම යොදාගැනීමට බලාපොරොත්තු වේ.<br><br><u>ගිවිසුම් කඩකිරීමේ අරමුදල - 2017 වර්ෂය සඳහා පොළී ආදායම රු.1,406,011</u>/-<br><br>විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් ගිවිසුම් කඩ කිරීම නිසා ඇතිවන මුදල් ලැබීම් තැන්පත් කිරීමෙන් මෙම අරමුදල ගොඩනැගී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 අනුව මෙම අරමුදල ආදායම් උපයන වත්කම්වල අයෝජනය කරන අතර ඉන් ලැබෙන පොළී මුදල් පහත අරමුණු සඳහා යොදා ගැනේ.<br><br>I. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය කෙටිකාලීන පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමට අරමුදල් සපයා ගැනීම. (උපරිමය රු.100,000/-)<br><br>II. විදේශ සමුළුවලට ඉදිරිපත් කිරීම සඳහා මූල්‍ය සහයෝගය ලබා දීම. (උපරිමය රු.40,000/-)<br><br>III. පර්යේෂණ පලකිරීම් (Publication) සඳහා මූල්‍ය සහයෝගය ලබා දීම.(උපරිමය රු.50,000/-)<br><br>IV. දේශීයව සමුළු,දේශන,වැඩමුළු සංවිධානය කිරීමට මූල්‍ය සහයෝගය |

| | | | |
|---|---|---|---|
| | | | ලබා දීම. (උපරිමය රු.50,000/-)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 407 හා 737 හි දක්වා ඇති නියමයන්ට අනුව හා පාලක සභාවේ අනුමැතිය (83/16) ට අනුව 2017 වර්ෂයේදී ගිවිසුම් කඩකිරීම මගින් ආචාර්යයවරුන්ගේ ලැබුණු මුදල් ගිවිසුම් කඩකිරීමේ අරමුදලට බැර කරන ලදි.<br><br>**කුලපති ශිෂ්‍යාධාර අරමුදල 2017 වර්ෂය සඳහා පොළී ආදායම රු.100,169/-**<br><br>අතිගරු කුලපති ස්වාමීන්වහන්සේගේ රු.1,000,000/- ක් වූ මූලා දායකත්වයෙන් මෙම අරමුදල ස්ථාපනය කල අතර ඉන් ජනනය වන පොළී ආදායම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීමට භාවිතා කෙරේ.<br><br>ඒ අනුව, අනුමත කරගත් නිර්ණායකයන් පදනම් කරගෙන සෑම වසරකම දෙවන වසර ශිෂ්‍යයන් 08 දෙදෙනෙකුට (එක් පීඨයකින් දෙදෙනෙකු බැගින්) ශිෂ්‍යත්ව ලබා දීම සිදු කරයි.<br><br>තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 407 හා 737 හි දක්වා ඇති නියමයන්ට අනුව හා පාලක සභාවේ අනුමැතිය (83/16) ට අනුව 2017 වර්ෂයේදී ගිවිසුම් කඩකිරීම මගින් ආචාර්යයවරුන්ගේ ලැබුණු මුදල් ගිවිසුම් කඩකිරීමේ අරමුදලට බැර කරන ලදි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 570 හා 571 | විවිධ ඉදිකිරීම් සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී රඳවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.13,346,065 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.<br>. | අතරැදවුම් වශයෙන් රඳවාගෙන තිබෙන මුදල් අදාල සැපයුම්කරුවන්ගේ/ කොන්ත්‍රාත්කරුගේ ලිඛිත ඉල්ලීම මත සිදු කරන අතර ඉදිකිරීම් වල / සැපයු භාණ්ඩ වල යම් දුර්වලතාවයක් තිබේ නම් ඊට අදාළ මුදල අයකරගෙන ඉතිරි රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>ඒ අනුව කල් ඉකුත් වූ තැන්පතු අදාළ තැන්පත්කරුවන්ට නිදහස් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 ජූනි 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය 2017.12.20 දිනට ආරම්භ කරන ලදි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සැසිය, වාර අවසාන විභාගය සහා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ වැඩ වර්ජනය හේතුවෙන් නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය අවසන්කර වාර්තාව භාරදීමට නොහැකි විය. මේ වන විට සමීක්ෂණ කටයුතු නිමකර ඇති අතර 2018.08.16 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | |
| | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | |
| | • 6:5:1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් කඩිනමින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙනු ඇත. |
| | • 7:2 ඡේදය | සියළුම රාජ්‍ය ව්‍යවසායයන් සතුව ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් තිබිය යුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් 2018 ජූනි 30 දින වන විටත්, මෙහෙයුම් අත්පොතක් පිළියෙල කර නොතිබුණි. | 2017 නොවැම්බර් 29 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) නිර්දේශය පරිදි ප්‍රසම්පාදනය සඳහා මෙහෙයුම් අත්පොත පිළියෙල කරඇති අතර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත මේ වන විට සකස් කරමින් පවති. |
| (ඈ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස්/01 දරණ ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | මුල්‍ය ප්‍රකාශන අනුව රු.64,220,660 ක් වූ පුස්තකාල පොත් හා වාර සඟරා සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා 2018 ජූනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල සමීක්ෂණ වාර්තා 130 වන විශ්වවිද්‍යාලීය පාලක සභාව නිර්දේශ මත මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිත අතර, ඉන් අනතුරුව විගණනයට ලබා දීමට කටයුතු කරමි. |
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 456 දෙනෙකු සඳහා 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.62,496,364 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුනද නිළධාරින් 454 දෙනෙකු පර්යේෂණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂණ දීමනා ලබා ගන්නා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සමහරක් තම පර්යේෂණ වාර්තා එළිදක්වමින් හා එය සුදුසු සහ අදාල පර්යේෂණ සඟරාවක (Research Journals) පළකිරීමෙන් පසු එය පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කොට තම පර්යේෂණ දීමනා ලබා ගන්නා අතර, අනෙක් පිරිස තම පර්යේෂණ යෝජනා පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කොට එහි නිර්දේශය මත පර්යේෂණ දීමනා ලබා ගනී. කෙසේ වෙතත් 2018 වර්ෂයේ සිට පර්යේෂණ යෝජනා ඉදිරිපත් කොට |

| | | | |
|---|---|---|---|
| | | | පර්යේෂණ කමිටුවේ නිර්දේශය ලබාගන්නා සියළු ව්‍යාපෘති සඳහා මාස 6 ක කාලයක් තුල අන්තර් පර්යේෂණ වාර්තාවක් ද (Biannual Report) පර්යේෂණය අවසන් කොට එහි අවසන් පර්යේෂණ වාර්තාව ද පර්යේෂණ කමිටුව වෙත ලබා දිය යුතු බව සියළුම පර්යේෂණ යෝජනා භාර දුන් නිළධාරීන් හා ආචාර්ය මණ්ඩලය වෙත දැනුම් දී ඇත. |
| (ඊ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | |
| | • X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය සහ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර නොගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.267,383,227 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල පද්ධතිය තුල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සඳහා අත්සන් කිරීමේ ලේඛනයක් හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම් සිදු නොවන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යයන වර්ෂ ආරම්භයේ දී දේශන සඳහා කාල සටහනක් ලබාදෙන අතර කාල සටහනට අනුකූලව එම නිලධාරීන් විසින් දේශන කටයුතු පවත්වාගෙන යනු ලැබේ. එම දේශන වාර්තා අධ්‍යයන අංශ තුල තබා ගනී. ඊට අමතරව සෑම මසකම අවසානයේ වැටුප් වේතන ගෙවීමට පෙර වැටුප් අංශය මගින් අදාළ අධ්‍යයන අංශ ප්‍රධානීන් මගින් අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සේවයේ නියුක්ත බවට මාසික වැටුප් සාරාංශයක් ලබා ගනී. එම මාසික වැටුප් සාරාංශය පදනම් කරගෙන අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා වැටුප් හා වේතන ගෙවනු ලබයි. |
| (උ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | | |
| | (i) 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය | ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට හිමි නිවාසවල 2014 වර්ෂයේ සිට පදිංචිව නිලධාරීන්ගේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවාස කුලී සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. | විශ්විද්‍යාලයේ පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය රඳවා ගැනිමටත්, ආකර්ෂණය කර ගැනීමටත් මුල් අවස්ථාවේ දී චක්‍රලේඛානුකූලව නිවාස කුලි අයකර නොගන්නා ලදී. නමුත්, 2017 වර්ෂයේ නිවාස කමිටු නිර්දේශ මත හා 122 පාලක සභා අනුමැතිය මත එම නිවාස වල අඩුපාඩු සම්පූර්ණ කළ පසු එම නිවාස සඳහා අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | (ii) 2015 නොවැම්බර් 07 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංස්ථාපිත චක්‍රලේඛය | විශ්වවිද්‍යාල අභ්‍යන්තර විභාග ප්‍රතිඵල, විභාගය පවත්වා මාස 03 ක් ඇතුලත නිකුත් කළයුතු වුවත් පසුගිය වර්ෂයේ දී පවත්වන ලද විභාග 6 ක හා සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග 12 ක ප්‍රතිඵල නිකුත් කිරීමේ දී මාස 01 සිට මාස 05 දක්වා වූ ප්‍රමාදයන් සිදු වී තිබුණි. | • සියළුම පීඨ සඳහා එකම කාල සීමාවක විභාග කාල සටහන ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයක් ලෙස ඒ සඳහා මාස 1 ½ පමණ කාලයක් වැයවීම<br>• සමහර විෂය ඒකක, අධ්‍යයන පාඨමාල අතර පමණක් නොව අධ්‍යයන පීඨ අතර ඇති එකිනෙක සබඳතාවය මත සමහර ආචාර්යවරුන්ට එම සියළුම පීඨ හා පාඨමාලවල අයත් සිසුන්ගේ ප්‍රශ්ණ පත්‍ර ඇගයීමට සිදුවීම.<br>• අළුතින් ස්ථාපිත විශ්වවිද්‍යාලයක් ලෙස ජ්‍යෙෂ්ඨ මට්ටමේ ආචාර්යවරුන්ගේ හිඟකම මත දෙවනවර පිළිතුරු ඇගයීම් සඳහා වෙනත් විශ්වවිද්‍යාල හා ආයතන වෙත කුරියර් සේවා මඟින් යැවේ. මේ සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම.<br>• විභාග අංශය තවමත් පීඨ අතර මධ්‍යගත නොවීම හා ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණයේ සිට ප්‍රතිඵල පිටකිරීමේ ක්‍රියාවලිය Manual ක්‍රමයට සිදුකිරීම.<br>• විභාග අංශය සතුව ප්‍රමාණවත් පරිදි මානව සම්පත නොමැතිකම වැනි හේතූන් මත මෙවැනි ප්‍රතිඵල ප්‍රමාද සිදුවේ<br>නමුත් විභාග අංශය අනාගතයේ මෙවැනි අනවශ්‍ය ප්‍රමාදයන් වැලක්වීම සඳහා නිතරම උත්සහ කරනු ලැබේ. |
| (ඌ) | ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ජ්/2/3/4 හා 2006 පෙබරවාරි 26 දිනැති ලිපිය සහ අංක සීඑස්ජ්/1/1/16 හා 2012 ජූනි 11 දිනැති ලිපිය. | රාජකාරී කටයුතු සඳහා විදේශගතවන නිලධාරීන් විසින් අදාළ විදේශ සංචාරයෙන් ශ්‍රී ලංකා රජයට ලැබෙන ප්‍රතිලාභ ඇතුලත් වාර්තාවක් සංචාරය නිමවා දිවයිනට පැමිණ සති 2 ක් ඇතුලත ඉදිරිපත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල අරමුදලෙන් රු.3,905,523 ක් වැයකර විදේශ සංචාරවල නිරත වූ ආචාර්යවරුන් 14 දෙනෙකු හා එක් නිලධාරියෙක් සහ රාජකාරී නිවාඩු මත විදේශගත වූ ආචාර්යවරු 07 දෙනෙකු විසින් අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | විදේශ සංචාරයන්ගෙන් පසුව තමා ලබාගත් දැනුම හා අත්දැකීම් පිළිබඳ වාර්තාවක් සැපයීම සිදු නොවී ඇති අතර, විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය වී ඇත්තේ අදාල සංචාරය තුලින් ලබාගැනීමට අපේක්ෂා කරන දැනුම හා ආකල්පයන් පිළිබඳ පූර්ව වාර්තාවක් සපයා අනුමැතිය ලබා ගැනිමයි. කෙසේ වුවත් මෙම ලුහුඩුතාවයන් හඳුනාගැනීමෙන් අනතුරුව 2018 වර්ෂයේ සිට සෑම විදෙස් සංචාරයක් අවසානයේ දීම ඉදිරිපත් කල යුතු වාර්තාවේ අකෘතියක් 2018.04.26 වන දින පැවති උපකුලපති උපදේශණ කමිටුවේ දී (Vice Chancellor's Advisory Committee) අනුමත කරවා ගෙන අදාල නිළධාරීන් දැනුවත් කර ඇති අතර, මේ දක්වා එසේ ලබා නොදුන් ආචාර්යවරුන් වෙත නැවත ලිඛිතව දැනුම් දී අදාල වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව අධ්‍යයන දීමනාව ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකත්වයට අදාල කර නොගත යුතුය. එහෙත් එම විධිවිධානයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.11,625,307 ක දායක මුදල් ඉහත අරමුදලට වැඩිපුර ගෙවා තිබුණි. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා අධ්‍යනය දීමනා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය සඳහා අදාල කරගනු ලැබුවේ 2013.01.08 දාතමින් යුත් විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ 1000 මඟින් දක්වා ඇති නියමයන්ට අනුවය.<br><br>2013 අයවැය යෝජනා අනුව අධ්‍යයන දීමනා ගෙවීම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති මෙම චක්‍රලේඛයේ 04 වන ඡේදයට අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල් දායකත්වයන් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව සලකා බැලීමට භාණ්ඩාගාරය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව වැටුප් පිළියෙල කිරීම සිදු කෙරේ. |

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.85,587,906 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.80,933,886 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,654,020 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.194,841,268 කින් වැඩි වී තිබුණ ද මුළු වියදම් රු.199,495,287 කින් වැඩිවීම නිසා පිරිහීමක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ පැවති රු.88,412,661 ක ඌනතාවය වාර්ෂිකව උච්චාවචනය වී තිබූ අතර, 2017 වර්ෂයේ දී රු.85,587,906 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුව ද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ දායකත්වය රු.107,634,799 ක්වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ දී රු.363,834,406 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | දීර්ඝ කාලයක් සේවය කළ පුහුණුවන්නන් 08 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව 2014 ජුලි 02 වැනි දින නඩුවක් පවරා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>විශ්වවිද්‍යාලයේ සේවය කල පුහුණුවන්නන් විසින් පවරා ඇති නඩුව පිළිබඳ විස්තර, මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මඟින් ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. |

### 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 2016-2020 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පිළියෙළ කර තිබුණු සංයුක්ත සැලැස්ම අනුව ලඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක 06 ක් දක්වා තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| (i) | 2016, 2017 වර්ෂවල උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 1,490 ක් බඳවාගත යුතු වුවද, සිසුන් 1,249 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 241 දෙනෙකු අඩුවෙන් බඳවා ගැනීම තුලින් සම්පූර්ණ ධාරිතාවය උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | අධ්‍යයන වර්ෂයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අවස්ථා කිහිපයක දී, විශ්වවිද්‍යාලය වෙත ලියාපදිංචිය සඳහා ශිෂ්‍ය ලැයිස්තු යොමුකර අතර, එම ලැයිස්තු වලට අදාලව ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. නමුත් ඇතැම් ශිෂ්‍යයන් ලියාපදිංචිය සඳහා සහභාගී වූයේ නැත. ලියාපදිංචි වූ ශිෂ්‍යයන් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් මත වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී යන ලද අතර, ශිෂ්‍යයන් කිහිපදෙනෙකු ලියාපදිංචිය අවලංගු කරගෙන ඇත. මෙවැනි හේතූන් මත අපේක්ෂිත ශිෂ්‍යය සංඛ්‍යාව අඩු වී ඇත.<br><br>අපේක්ෂිත ශිෂ්‍යයන් සංඛ්‍යාව අඩු වීම හේතුවෙන් අතිරේක ශිෂ්‍යයන් අප විශ්වවිද්‍යාල[illegible] වෙත අනුයුක්ත කරන මෙන් ඉල්ලා 2017.02.02 දාතමින් |

<table>
<tr><td></td><td></td><td>අප විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත ලිපියක් ද යොමු කරන ලදී. ඉන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කල ලැයිස්තු වලට අදාලව ද ශිෂ්‍යයන් බඳවා ගැනිමට කටයුතු කලද අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ නොවීය.</td></tr>
<tr><td>(ii)</td><td>විශ්වවිද්‍යාලය විසින් 2010/2011 සහ 2011/2012 අධ්‍යයන වර්ෂ සඳහා බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 998 දෙනෙකු වූ අතර උපාධිය ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව 860 දෙනෙකු විය. ඒ අනුව උපාධිය සම්පූරණ කර නොගත් ශිෂ්‍ය සංඛ්‍යාව ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 14 ක් විය.</td><td>විශ්වවිද්‍යාලය විසින් 2010/11 සහ 2011/12 අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් 998 ක් ලියාපදිංචි වූ අතර, උපාධිය ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව 860 ක් වේ. පාඨමාලා අතහැර යාම, ලියාපදිංචිය අවලංගු කර ගැනීම, විභාග සඳහා පෙනී නොසිටීම මෙන්ම විභාග අසමත් වීම යනා දී කාරණා නිසා උපාධිය ලබා පිටවූ සංඛ්‍යාව ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු වේ.</td></tr>
<tr><td>(iii)</td><td>ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා, අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුලින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම අරමුණක් වී තිබුණ ද පසුගිය වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී එක් විදේශීය සිසුවෙකු බැගින් පමණක් බඳවාගෙන තිබුණි.</td><td>පාඨමාලාවන් සඳහා විදේශීය ශිෂ්‍යයන් උසස් අධ්‍යාපන අමාත්‍යංශය මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කරන අතර, එසේ යොමු කරන ලද ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>(v)</td><td>2014 වර්ෂයේ දී සියයට 77 ක් වූ සේවා නියුක්තිය 2017 වර්ෂයේ දී 100 දක්වා වර්ධනය කර ගැනීමට ආයතනයේ අරමුණ වුවද, 2011/2012 අධ්‍යයන වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ දී උපාධිය ලබා පිටවූ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබද විශ්වවිද්‍යාල මඟින් සිදු කර තිබූ සංගණනයේ දී සේවා නියුක්තිය සියයට 62 සිට සියයට 74 දක්වා පරාසයක පැවතුනි.</td><td>ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෘත්තිය මාර්ගෝපදේශණ ඒකකය ශිෂ්‍යය ශිෂ්‍යාවගේ වෘත්තීය දැනුම හා ව්‍යවසායකත්ව දැනුම වැඩිකිරීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>• වෘත්තීය මාර්ගෝපදේශණන පාඨමාලා ඒකක හඳුන්වා දිම.<br>වෘත්තිය මාර්ගෝපදේශණ ඒකකය විසින් වෘත්තීය සංවර්ධන පාඨමාලා ඒකක 3 ක් (3 credits weight) පළමු,දෙවන හා තෙවන වසර ENM සහ HTE සිසුන් වෙනුවෙන් හඳුන්වා දී ඇති අතර මින් මොඩියුල් 1 සහ 3 මෙම අර්ධවාර්ෂිකය තුල පවත්වා ඇත.<br><br>
<table>
<tr><th>Module No.</th><th>Course Code</th><th>Course Title</th><th>year</th><th>semester</th><th>No of Hours</th></tr>
<tr><td>Module 1</td><td>BGE 198-1</td><td>Career Development I</td><td>1st year</td><td>1st semester</td><td>30</td></tr>
<tr><td>Module 2</td><td>BGE</td><td>Career</td><td>2nd</td><td>2nd semester</td><td>30</td></tr>
</table>
</td></tr>
</table>

<table>
<tr>
<td></td>
<td></td>
<td>
<table>
<tr><td></td><td>298-1</td><td>Development II</td><td>year</td><td></td><td></td></tr>
<tr><td>Module 3</td><td>BGE<br>398-1</td><td>Career<br>Development III</td><td>3rd<br>year</td><td>1st semester</td><td>30</td></tr>
</table>
තවද මෙ සම්බන්ධ වැඩමුළුවක් 2018 ජූනි මස දී පවත්වා ඇත.
<ul><li><u>උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය වැඩ සටහන</u></li></ul>
වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය හා ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය (NEDA) ඒක්ව උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය වැඩ සටහනක් පවත්වා ඇති අතර, මෙහි අරමුණ වූයේ සාර්ථක උපාධිධාරී ව්‍යවසායකයකු බිහි කිරීම, අවශ්‍ය රැකියා අවස්ථා නිර්මාණය කිරීම හා ශිෂ්‍යය ශිෂ්‍යාවන් ව්‍යාපාරික අංශයට යොමු කිරීම වේ.
<ul><li><u>වෘත්තීය රැකියා වෙළඳ පොල හා ප්‍රදර්ශණය</u></li></ul>
වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය විසින් වෘත්තීය රැකියා වෙළඳ පොල හා ප්‍රදර්ශණයක් පැවත්වීම සඳහා සැලසුම් කර ඇති අතර, මෙහි අරමුණු ලෙස රැකියා අවස්ථා සම්බන්ධයෙන් ශිෂ්‍යයන් හා සේවායෝජකයන් අතර අදහස් හා තොරතුරු හුවමාරු කර ගැනීම හා ශිෂ්‍යයන් හා ඌව පළාත් ජනතාව ලෝක රැකියා වෙළඳ පොලේ නව ප්‍රවනතා සම්බන්ධයෙන් දැනුවත් කිරීම වේ.
</td>
</tr>
<tr>
<td>(ආ)</td>
<td>විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කමිටුව විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති 33 ක් අනුමත කර ඒ වෙනුවෙන් රු.37,520,707 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ව්‍යාපෘති 21 පමණක් ආරම්භ කර තිබුනු අතර ඉන් 20 ක් නිම කිර තිබුණි එසේ වුවද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 56 ක් එනම් රු.21,0227,409 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද ඌන උපයෝජිත පැවතුනි. කෙසේ වුවද, නිමකරන ලද ව්‍යාපෘති වාර්තා 20 පදනම් කරගෙන නව නිපැයුම් හෝ සේවා ජනිත කර ඒ සඳහා ප්‍රේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය</td>
<td>
2015 වර්ෂය තුළ දී පර්යේෂණ යෝජනා 32 ක් අනුමත වී තිබුණ ද, ඒවාට අදාළ වියදම් දැරීම ප්‍රධාන වශයෙන් සිදුවූයේ 2016 වර්ෂය තුලයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂය තුළ දී දැරූ මුළු පර්යේෂණ වැය රු. 7,162,475.00 ක් වූ අතර, එය එම වර්ෂයේ මූලික අයවැය ප්‍රතිපාදනය ද ඉක්මවා ඇත.
2017 වර්ෂය සඳහා වෙන් කර මුදල රු.මිලියන 7.5කි. නමුත් වර්ෂය අවසාන වන විට මිලියන 8.3 පර්යේෂණ වියදම් ලෙස දරා ඇත. මෙය අදාල වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් 110% ක
</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| | වැඩ පිලිවෙලක් සකස් කර නොතිබුණි. | ප්‍රතිශතයකි. තවද 2014,2015,2016 වර්ෂ සදහා ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සියල්ලම 2017 වර්ෂය තුල අවසන් කර ඇත.<br><br>ප්‍රසම්පාදන ක්‍රියාවාලිය ප්‍රමාද වීම, ආදල ව්‍යාපෘතිය අපේක්ෂිත මට්ටමට නිම කිරීමට කාලයක් ගත වීම හා සමහර ව්‍යාපෘති විවිධ ප්‍රයෝගික ගැටළු මත ඉල්ලා අස්කර ගැනීම වැනි හේතුන් මත පර්යේෂණ සදහා වෙන්කර තිබූ ප්‍රතිපාදන අඩුවෙන් උපයෝජනය සිදූ වී ඇත.<br>පර්යේෂණ ව්‍යපෘතිවල ප්‍රතිඵල තුලින් නව නිෂ්පාදන හා සේවා අපේක්ෂා කිරීම සැමවිටම ප්‍රයෝගික නොවේ.කෙසේ නමුත් පර්යේෂණ කමිටුව විසින් පර්යේෂණ ප්‍රදානලාභීන් වෙත දන්වා ඇත්තේ පර්යේෂණ ව්‍යාපෘති වල ප්‍රතිඵල මත සුදුසු පරිදි ප්‍රේටන්ට් බලපත්‍ර ලබා ගැනිමට වැඩකරන ලෙසත්, එමෙන්ම එය සුදුසු සහ අදාල පර්යේෂණ සඟරාවක (Research Journals) පළකරන ලෙසත්ය. |

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සදහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | වර්ෂ 2010 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුල දී මිලදී ගෙන තිබුණු රු.593,799 ක වටිනාකමක් සහිත තොග අයිතම 17 ක් කල් ඉකුත් වී තිබුණු අතර විගණිත දිනය වූ 2018 ජූනි 30 දින වන විටත් එම තොග අපහරණය කර නොතිබුණි. | එම භාණ්ඩ කල් ඉකුත් වී ඇති භාණ්ඩ වන අතර,2017 පෙබරවාරි, මාර්තු මසයන් හි පැවති අනධ්‍යයන වැඩවර්ජනය හේතුවෙන් තොග අපහරණය ප්‍රමාද විය. එබැවින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ඉදිරියේදී එම භාණ්ඩ ඉවත් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරිම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළව 2008 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ ගත් තීරණය අනුව, විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු හෙක්ටයාර් 30.9667 ක ඉඩම්වල අයිතිය මෙම වාර්තාවේ දින වන විටත් විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි. | මෙ පිළිබද 2006 වසර සිට කටයුතු සිදූ කර ඇත. එසේම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉඩම් හා පාර්මේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නිර්දේශ ඇතිව මේ වන විට අදාළ ඉඩම විශ්වවිද්‍යාලයට පැවරීමට කටයුතු සිදූකරමින් පවතී. එසේම මේ සඳහා පළපුරුදූ විශ්‍රාමික නිළධාරියකු පැවරුම් පදනම මත විශ්වවිද්‍යාලය මගින් පත් කර ඇත.<br><br>ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මගින් 2018.01.23 දිනැතිව එවන ලද ලිපියේ සදහන් පරිදි මෙම ඉඩම ඉඩම් හා පාර්මේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලයට පැවරීමට කටයුතු සිදූකර ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.3,247,475 ක විදේශ ගමන් වියදම් දරා තිබුණි. | පශ්චාත් උපාධි සඳහා සංචාරක ප්‍රදාන:- චක්‍රලේඛ ප්‍රතිපාදන මේ සඳහා ඇති බැවින්, මූල්‍ය කමිටු අනුමැතිය ලබා ගැනීම අත්‍යවශය සාධකයක් නොවේ.<br><br>විදේශ සංචාර,වැඩමුළු, සම්මන්ත්‍රණ හා කාර්ය මණ්ඩල සම්මන්ත්‍රණ :- මේ සඳහා මූල්‍ය කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මූල්‍ය කමිටු ප්‍රධානිය මෙන්ම ආයතන ප්‍රධානියා වන උපකුලපති ගේ අනුමැතිය මත මෙම වියදම් සිදුකොට ඇත. |

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් සපයා තිබුණු සිසුන් 1,849 දෙනෙකු අතුරින් සිසුන් 841 දෙනෙකු හෙවත් සියයට 46 ක් සඳහා කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සිසුන් 506 දෙනෙකුට පහසුකම් ලබා දිය හැකි නේවාසිකාගාර 04 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර, නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා කුලි නිවාස ලබා ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුලදී රු.21,638,235 ක් වැයකර තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර 12 ක් පමණ ගතවී තිබුණ ද ස්ථිර නේවාසිකාගාර ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බදුල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත කිරිමට මූලික වූ එක් කරුණක් වූයේ දිස්ත්‍රිකයේ හා පළාතේ වූ ආර්ථික මට්ටම ඉහළ නැංවීමේ ඌව වෙල්ලස්ස සංවර්ධන ව්‍යාපෘතිය යටතේය. එහිදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ නෙවාසිකාගාර 04 ක් ඉදිකරණ ලදී. එමගින් විශ්වවිද්‍යාල සිසුන් 500 කට නේවාසික පහසුකම් සපයා ඇත. එසේම එවක රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව වසර 2014 තෙක් නෙවාසිකාගාර ඉදිකිරීම වෙනුවට විශ්වවිද්‍යාලය අවට නිවාස නේවාසිකාගාර ලෙස භාවිතා කිරීමෙන් එම නිවාස හිමියන්ගෙ අර්ථිකය නැංවීමට රුකුලක් කරගන්නා ලදී.<br><br>කෙසේ වෙතත් 2014 – 2017 කාල වකවානුව තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විශ්වවිද්‍යාල සඳහා නේවාසිකාගාර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ අතර එ සඳහා සමතලා භූමියක් අත්‍යාවශ්‍ය විය. විශ්වවිද්‍යාලය සතු භූමිය තුළ සමතලා භූමියක් නොමැති බැවින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කළ එවක නිළධාරීන් භූමිය පරික්ෂා කළ පසු දැනට විශ්වවිද්‍යාලය සතු භූමිය යොග්‍ය නොවන බව දන්වන ලදී. එසේම එවක සිටි නිළධාරීන් ඒ සඳහා සුදුසු ඉඩම් බදුල්ල ප්‍රදේශයේ විශ්වවිද්‍යාලයේ අවට්න් සෙවීමට විශාල පරිශ්‍රමයක් දැරිය. තවද පුවත්පත් දැන්වීම් පළ[illegible]ර ඉඩම් ලබා ගැනීමට උත්සහා දැරිය. මෙසේ සොයාගත් |

| | | |
|---|---|---|
| | | සමහර ඉඩම් වල උස් ගොඩනැගිලි ඉදිකිරිමට නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වන ලදී. නමුත් මේ වන විට නේවාසිකාගාර සඳහා වේවැස්ස වතුයායට අයත් බදුල්ල ප්‍රාදේශිය සභාව ඉදිරියේ වූ අක්කර 12 ක ඉඩම ලබා ගැනීමට කටයුතු කරමින් පවති. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ කුලී පදනම මත වාහන 14 ක් යොදාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් රු.16,601,629 ක් වැය කර තිබුණි. එසේම පසුගිය වර්ෂ 04 ක කාලයක් සඳහා කුලිය වශයෙන් රු.65,055,751 ක් ගෙවා තිබුණු අතර, විශ්වවිද්‍යාලය ස්ථාපිත කර, වසර 12 ක් ගත වී ඇතත් වර්ෂික අයවැය ලේඛන මඟින් ප්‍රතිපාදන සලසා ගැනීම තුලින් අත්පිට කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය රථවාහන කුලියට ගනු ලබනුයේ රථවාහනය,ඉන්ධන, රියදුරු, රියදුරු වේතනය, රක්ෂණය, මාසික සේවා හා නඩත්තුව, අනෙකුත් නඩත්තු සඳහා වූ සියලු වියදම් ඇතුලත්ය.( මෙහිදි නිළධාරීන් සඳහා වෙන් කළ වාහන සඳහා ඉන්ධන යෙදීම විශ්වවිද්‍යාලය මඟින් සිදුකරනු ලැබේ.) ඒ අනුව විගණන විමසුමෙ සඳහන් මිල ගණන් වාහන සඳහා ගෙවන කුලිය මෙන්ම ඉහත සඳහන් අනෙකුත් වියදම් ද ඇතුලත්ව ඇත. |

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභසාධක අරමුදල යන අරමුදල්වල 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,314,079 ක ශේෂයක් වූ අතර වර්ෂය තුල කිසිඳු කාර්යක් සඳහා එම අරමුදල් උපයෝජනය කර නොතිබුණි. | මෙම අරමුදල් ක්‍රියාත්මක කිරීම ලැබීම් හා යෙදවීම් සම්බන්ධව කටයුතු යාවත්කාලීන කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුව විසින් කමිටුවක් පත්කිරීමට නිර්දේශ කර ඇති අතර, එම කමිටු වාර්තා ලබාගැනීමෙන් අනතුරුව අදාල අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය දී රාජ්‍ය ආයතන 2 කින් හා එක් ව්‍යාපෘතියකින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ 02 ක විවිධ වැඩසටහන් සඳහා ලැබී තිබුණු රු.1,308,853 ක මුදලින් සියයට 20 ක් ප්‍රයෝජනය නොගෙන ඉතිරි වී තිබුණි. | කළමණාකරණ පීඨය හා සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය විසින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් තවමත් අවසන් වී නොමැති බැවින් එම වැඩසටහන් අවසන් වූ වහාම අදාල මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

### 4.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සදහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මගින් රු.2,043,499 ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් 2016 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටර් රථය, රෝද හතරේ ට්‍රැක්ටර් රථය සහ නඟුල හා උපාංග සහ රු.6,270,760 ක් වැය කර සමාලෝචිත වර්ෂයේ දී මිල දී ගෙන තිබුණු ඉගැනුම් හා කාර්යාල උපකරණ විගණිත දිනය වන 2018 ජූනි 30 වන දින දක්වාම එම අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | **රු.2,043,499** ක් වැය කර මිලදී ගත් රෝද දෙකේ ට්‍රැක්ටර් රථය, රෝද හතරේ ට්‍රැක්ටර් රථය සහ නඟුල හා උපාංග<br><br>තාක්ෂණික පියය සඳහා දැනට සිසුන් කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇති අතර, ඔවුන්ගේ ප්‍රයෝගික ඉගැනුම් ක්‍රියාකාරකම් සඳහා අදාල යන්ත්‍ර හා උපකරණ යෙදවීමට කටයුතු කරන අතර, රෝද 4 ට්‍රැක්ටර් රථය විශ්වවිද්‍යාලයේ සාමන්‍ය පරිපාලන හා නඩත්තු අංශයේ කටයුතු සඳහා යොදවා ගනු ලබන බව ද දන්වමි.<br><br>**රු.6,270,760** ක් වටිනා ඉගැනුම් හා කාර්යාල උපකරණ<br>• පරිගණක මේස හා පුටු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පරිගණක විද්‍යාගාරය තුල ගබඩා කර තිබීම.<br><br>ආචාර්ය ආර්.ජ්.පී.අයි. ධර්මදාස මහතා මෙම විෂය හා සම්බන්ධව කටයුතු කරන අතර,එම ඇනවුම් කරන ලද භාණ්ඩ ගබඩා කිරීමට දැනට වෙනම විද්‍යාගාර පහසුකම් නොමැති බැවින්, තාවකාලිකව ඉහත විද්‍යාගාරය තුල ගබඩා කර ඇත. නිශ්චිත විද්‍යාගාර පහසුකම් ලැබුණු පසු එම භාණ්ඩ අදාල ස්ථානය වෙත යොමු කරන බව දන්වා ඇත.<br><br>• Extractor 15 bar suitable for 4 ceramic palters - පාංශු ජල විද්‍යාගාරය<br><br>මහාචාර්ය එච්.එම්.එස්.කේ. හේරත් මහතා මෙම විද්‍යාගාරය හා සම්බන්ධව කටයුතු කරන අතර, ඉහත සදහන් උපකරණය එම විද්‍යාගාරය තුලදී භාවිතා කිරීමට අපහසු වී ඇත්තේ එය භාවිතා කරන්නන් සඳහා අවශ්‍ය කරන ආරක්ෂාව එම කුඩා ඉඩකඩ තුල ලබා දිය නොහැකි නිසාවෙනි. මෙම උපකරණය ආරක්ෂාකාරීව භාවිතා කිරීමට සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබා ගැනීම සඳහා දැනටමත් අවශ්‍ය පියවර |

| | | |
|---|---|---|
| | | ගෙන ඇත.<br>• කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය - LCD Projector Screen<br>ඉහත උපකරණය 2017 දෙසැම්බර් මස මිලදී ගත් අතර, එය සවිකිරීම සඳහා අවශ්‍ය වන දෘඪ බිත්තිය ඒ වන විට ඉහත මධ්‍යස්ථානයේ දේශණ ශාලාව තුල නොමැති බැවින්, එම අවස්ථාවේ එය සවි කිරීමට අපොහොසත් විය. දැනට එම මධ්‍යස්ථානයේ දේශණ ශාලාව ඇතළු අනෙකුත් කොටස් (බිත්ති ඇතුළුව) අළුත්වැඩියා කරන ලද අතර, 2018 අප්‍රේල් මස වනතුරු එම ඉදිකිරීම් සිදුවිය. ඒ අතරතුර අධ්‍යක්ෂක/කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් LCD Projector Screen එක ස්ථාපනය කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉල්ලීම් කර තිබුණු අතර, දැනට ඒ සඳහා කටයුතු සැකසෙමින් ඇති බව දන්වන අතරම ඉදිරි මාස කිහිපය තුල එය භාවිතයට ගත හැකි වනු ඇත. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ එෆ් කොටසේ වෙන්කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (partition and other improvements to Block F) 2017 සැප්තැම්බර් 23 වන දින රු.16,952,719 ක ගිවිසුම්ගත මුදලකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා තිබුනු අතර, විගණිත දිනය වූ 2018 මාර්තු 06 දිනට කල වැඩ වෙනුවෙන් රු.15,619,407 ක් කර්යාංශයට ගෙවා තිබුණි. එසේ වුවද විදුලි බල්බ සවිකරන ස්ථාන (Lamp Points) 34 ක් භාවිතයට ගැනීමට නොහැකි වන සේ සිවිලිම සවිකර තිබුණ බව 2018 මාර්තු 06 වන දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඒ අනුව ඒ සඳහා වැය කල රු.187,000 ක් නිෂ්කාර්ය ගෙවීමක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරු නියමිත නඩත්තු කාලය (Defects liability period) තුල ඉහත අඩුපාඩුව නිවැරදි නොකිරීම මත එම කොන්ත්‍රාත්තුවේ රඳවාගැනීම් (Retention) ගාස්තුවෙන් අදාල මුදල වූ රු:187,000 ක් අයකර ගැනීමට කටයුතු කොට ඇත. |
| (ඇ) | භාණ්ඩ මිලදී ගැනීමේ දී, අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම කෙරෙහි අවධානය යොමු කර නොතිබීම හේතුවෙන් 2015 මැයි 21 දින හා සැප්තැම්බර් 11 වන දින මිලදී ගෙන තිබුණු A3 වර්ගයේ ජයා පිටපත් කඩදාසි වලින් රු.653,193 ක් වටිනා ඡායා පිටපත් පැකට් 710 ක් විගණිත දිනය වූ 2018 මැයි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවතුනි. | විභාග අංශයේ ප්‍රයෝජනය සඳහා මිලදී ගෙන ඇති A3 වර්ගයේ ඡායාපිටපත් කඩදාසි පැකට් 785ක් විගණිත දිනයට පැවතිය ද 2018.05.15 දිනට ශේෂය පැකට් 710කි. අදාල කාලසීමාව තුල පැකට් 75 ක් ප්‍රයෝජනය සඳහා ගෙන ඇති බව දන්වමි. එම ඡායාපිටපත් කඩදාසි විභාග අංශයේ ප්‍රයෝජනය සඳහා යොදා ගත හැකි බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ) | තොග පාලන කටයුතු වෙනුවෙන් රු.165,000 ක් වැයකර 2016 නොවැම්බර් 24 දින මිලදී ගෙන තිබුණු පරිගණක මෘදුකාංගය 2017 දෙසැම්බර් 31 දින වන විටත් තොග පාලන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | 2017 වර්ෂයේ සියළු දත්ත පරිගණකගත කල ද ඇණවුම් පත්‍ර මෘදුකාංග වැඩසටහන ඇතුලත් කිරීමේ දී ඇති වූ තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුව ද මේ වන විට මෙම වැඩසටහන ක්‍රියාවට නංවා තිබේ. 2018 වර්ෂයේ ආරම්භක තොග ශේෂයන්ට අදාළ දත්ත පරිගණකගත කොට ඇති අතර භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීමේ පත්‍රිකාවන්ට අදාල දත්ත ඇතුලත් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. |

## 4.6 ආර්ථික නොවන ගණුදෙනු

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | විශ්වවිද්‍යාල කුලී පදනම මත වාහන සැපයුම්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව කුලී වාහන රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට එකඟ වී නොතිබුණ ද එම රියදුරන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් කුල පදනම මත ලබා ගත් නිවාසයක් ලබාදී ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.240,000 ක් විශ්වවිද්‍යාලයේ අරමුදල් මගින් වැය කර තිබුණි. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථාපනය කිරීමේදී හා එහි අවශ්‍යතා සඳහා කුලී පදනම මත වාහන ලබා ගන්නා ලදි. එහිදි 2006 සිට මේ දක්වා විශ්වවිද්‍යාලය වෙනුවෙන් යොදවා ඇති රියදුරන් සඳහා රියදුරු නේවාසිකාගාරයක් හෝ රියදුරන් හට රැඳී සිටීමට හෝ විවේක ගැනීමට හා රාත්‍රියේ ශිෂ්‍ය අවශ්‍යතා හා අනෙකුත් කටයුතු වලට වාහන යෙදවීමට අපහසු විය. එම නිසා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පිවිසුමේ සිට මීටර් 25 පමණ දුරින් පිහිටි නිවසක් හඳුනා ගෙන කුලී පදනම මත ලබා ගන්නා ලදි. එහි රියදුරන්ට අමතරව ජලනළ කාර්මික හා විදුලි කාර්මිකද නවාතැන් කටයුතු වෙනුවෙන් භාවිතා කරන ලදි.එම නිසා විශ්වවිද්‍යාලයේ ඉහත සේවකයින්ගේ අවශ්‍යතාවය පැය 24 පුරා ලබා ගැනීමටත් එම සේවාව කඩිනමින් අවශ්‍ය වේලාවට ලබා ගැනීම සඳහා මෙම ක්‍රියා මාර්ගය ගන්නා ලදි.<br><br>මෙහිදී කුලී පදනම මත ලබා ගන්නා ටෙන්ඩරයේ කොන්දේසි මාලාවේ හෝ ගිවිසුම්පතේ නිවාස විශ්වවිද්‍යාලය විසින් ලබා දීම සඳහන් කර නොතිබූ අතර එය වාහන අයිතිකරු විසින් දිය යුතු බවද සඳහන් කර නොමැත. කෙසේ වෙතත් 2018 වසරේ සිට මසකට රු.2000/- මුදලක් සෑම රියදුරෙකුගෙන්ම අය කර ගැනීමට කටයුතු කොට ඇති අතර ටෙන්ඩර් පත්‍රයටද ඒ බව ඇතුලත් කර ඇත. |

**4.7** කාර්යමණ්ඩල පරිපාලනය

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | අධ්‍යයන කාර්යමණ්ඩලය | |
| (i) | 2006 වර්ෂයේ දී 10 ක් වූ විශ්වවිද්‍යාලයේ අනුමත මහාචාර්ය තනතුරු සංඛ්‍යාව 2017 වර්ෂයේ දී 05 දෙනෙකු දක්වා අඩු කර තිබුනු අතර, 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති එම තනතුරු පිරවීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ආරම්භයේ දී සිට පැවති මහාචාර්ය තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වරින් වර පුවත් පත් දැන්වීම් පළකර තිබූ අතර 2017 නව කාර්ය මණ්ඩල තනතුරු සංශෝදනයේ දී එම තනතුරු සංඛ්‍යාව 5 ක් දක්වා අඩුකර තිබුණි. මෙකී තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2017.06.18 වන දින පුවත්පත් දැන්වීමක් පළකර අතර, ලැබූ අයදුම්පත්අතර, සුදුසුකම් ලත් අයදුම්පත් නොතිබීම හේතුවෙන් බඳවා ගැනීම් සිදු නොකෙරුනි. 2018 වර්ෂය සඳහා වූ බඳවා ගැනීමේ සැලස්මට අනුව 2018 අවසන් කාර්තුවේ දී නැවත පුවත්පත් දැන්වීමක් පළ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු වලින් විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතින අතර අනුමත තනතුරු 275 කින් තනතුරු 83 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවතුණි.<br>. | 2017 වර්ෂය සඳහා ලැබුණු නව කාර්ය මණ්ඩල තනතුරු අනුමැතියක් සමඟ 2017.12.31 වන දිනට පුරප්පාඩු සංඛ්‍යාව 83 ක් වේ. මෙම සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාවෙන් 31 ක්ම තාවකාලික ශිල්ප ප්‍රදර්ශක/තාවකාලික කතිකාචාර්ය තනතුරු වූ පුරප්පාඩු වේ. මෙම තාවකාලික තනතුරු පිරවීම එක් එක් අධ්‍යයන පීඨයන්හි කාලීන අවශ්‍යතාවය මත සිදු කරන බැවින් එකී පුරප්පාඩු පිරවීම සිදුවන්නේ අදාල පීඨයන් හි පීඨාධිපතිවරුන්ගෙන් ලබාගන්නා වූ ඉල්ලීම් මත පමණි.<br><br>ස්ථිර කථිකාචාර්ය තනතුරු සඳහා 2017.12.31 දිනට පුරප්පාඩුව පැවති තනතුරු 52 පුරප්පාඩු පිරවීම සඳහා 2017 ඔක්තෝබර් මස දී පුවත්පත් දැන්වීම් පළකර අතර, පළාත් පාලන මැතිවරණය, අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩවර්ජනය හේතුවෙන් ප්‍රමාද වූ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු 2018 මාර්තු මස ආරම්භ කල අතර, දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

| ආ | පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය | |
|---|---|---|
| (i) | 2006 ජූනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 77 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි. | 2017 වර්ෂයේ අනුමත නව කාර්ය මණ්ඩල සංශෝධනයෙන් නව තනතුරු ප්‍රමාණය සමඟ 2017.12.31 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 77 ක් වේ. මේ අතුරින් පරිපාලන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සිදුකෙරෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් බැවින් ඒ සඳහා මෙ වන විටත් කටයුතු කෙරෙමින් පවතී. ඉදිරි අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු වලින් පුරප්පාඩු 35 ක් ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ 876 ට අනුව සිදුකල යුතු බඳවා ගැනීම් බැවින් අදාල පුරප්පාඩු සංඛ්‍යාව දන්වා නාම ලේඛණ ලබා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් උසස් අධ්‍යාපන අමාත්‍යංශය දැනුවත් කිරීම් කර ඇත.<br><br>බාහිර බඳවා ගැනීම් බඳවා ගැනීමේ කටයුතු ඉදිරි තනතුරු 12 ක් සඳහා පුවත්පත් දැන්වීම් 2017 ඔක්තෝබර් මස දී පළකළ අතර, බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. |
| (ii) | විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති තනතුර විශ්වවිද්‍යාලයේ ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතින අතර 2017 ජූලි 21 වන දින පැවති 123 වන පාලක සභා රැස්වීමේ අනුමැතිය මත සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති 2017 අගෝස්තු 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා රු.150,000 ක දීමනාවක් මත පුස්තකාලාධිපති ලෙස පත්කර තිබුණි. අනතුරුව 2017 දෙසැම්බර් 22 දින පැවති 128 වන පාලක සභා රැස්වීමේ තීරණය මත අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ පුස්තකාල උපදේශක තනතුරක් සඳහා එම නිළධාරිනිය 2018 ජනවාරි 01 දින සිට රු.225,000 දීමනාවක් මත පත්කර තිබුණි. ඒ අනුව පුස්තකාලාධිපති තනතුර පුරප්පාඩුව පැවතිය දී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවන පුස්තකාල උපදේශක තනතුරක් සඳහා බඳවාගෙන තිබුණි. | රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකලයාධිකාරි ලෙස සේවය කරන ඒ.එස්. සිරිවර්ධන මිය සප්ත වාර්ෂික නිවාඩු පදනමින් 2017 අගෝස්තු 01 වන දින සිට වසරක කාලයක් සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරි ලෙස පත්කර ගන්නා ලදී. මෙකී පත්වීම සඳහා 2017 ජූලි 21 වන දින පැවති 123 වන පාලක සභාවේ අනුමැතිය ලැබුණු අතර, ඇයට 150,000 ක මාසික දීමනාවක් ගෙවීමට එහි දී තීරණය විය.<br><br>මෙහි දී එම ගෙවීම් අනුපාතය තීරණය කිරීමේ දී පාලක සභාව විසින් පදනම් කර ගනු ලැබුවේ එවක සප්ත වාර්ෂික නිවාඩු පදනමින් විශ්වවිද්‍යාලයේ සේවය කරමින් සිටි මහාචාර්යවරුන් දෙදෙනාට ගෙවනු ලැබූ මාසික දීමනාවයි.<br><br>2017 දෙසැම්බර් මස 22 වන දින පැවති 128 වන පාලක සභාවේ දී ගත් තීරණයක් අනුව සියළු සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණ විශ්වවිද්‍යාලයේ සේවය කර නිළධාරින්ගේ තනතුරු නාමයන් පහත සඳහන් පරිදි වෙනස් |

| | | |
|---|---|---|
| | | කිරීමටත් ඒ ඒ තනතුරු සඳහා පොදු මාසික දීමනාවක් ගෙවීමටත් තීරණය විය.<br>• ජ්‍යෙෂ්ඨ උපදේශක<br>• උපදේශක<br>• කණිෂ්ඨ උපදේශක - I<br>• කණිෂ්ඨ උපදේශක - II<br>එබැවින් එවකට සප්ත වාර්ෂික නිවාඩු පදනම මත සේවය කරමින් සිටි ඒ.එස් සිරිවර්ධන මහත්මියගේ තනතුරු නාමය ද උපදේශක (පුස්තකාල සේවා) ලෙස වෙනස් කිරීමට 128 වන පාලක සභාවේ දීම තීරණය විය. (Council minutes No. 128.03.06) තනතුරු නාමය වෙනස් කිරීමෙන් අනතුරුව නව පත්වීමේ ලිපිය, කොන්ත්‍රාත්තුවේ ඉතිරි කාලය සඳහා එනම් 2018 ජනවාරි 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා වූ කාලය සඳහා 2018 අප්‍රේල් 23 වන දින දාතම සහිතව, පත්වීමේ ලිපිය නිකුත් කරන ලදී.<br>විශ්වවිද්‍යාලය සතු අනෙකුත් පුරප්පාඩු පිරවීම දී මෙන්ම පුස්තකාලයාධිකාරී තනතුර පිරවීමේ දී ද ප්‍රමාණවත් තරම් සුදුසුකම් ලත් පුද්ගලයින් ඉල්ලුම් නොකිරීමේ හේතුව මත පුස්තකාලයාධිකාරී තනතුර පුරප්පාඩු පිරවීමද දුෂ්කර වී ඇත. එවැනි තත්වයක් මත විශ්වවිද්‍යාල පද්ධතියේ අත්දැකීම් සහිත පුස්තකාලයාධිකාරීවරියක් සප්ත වාර්ෂික නිවාඩු පදනමින් හෝ පත්කර ගැනීමට 2017 වසරේදී හැකියාව ලැබුණි. නව පාලක සභා තීරණයට අනුව සිදුවී ඇත්තේ ඇයගේ තනතුරු නාමය වෙනස් වීම පමණක් බව මෙහිදී දැනුම් දීමට කැමැත්තෙමි. |
| (iii) | විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු තනතුර විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට විගණිත දිනය වූ 2018 ජූනි 30 දින දක්වා පුරප්පාඩුව පැවති අතර එම තනතුර සඳහා ඌව පළාත් සභා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා 2015 දෙසැම්බර් 02 දින සිට මාසිකව රු.50,000 ක දීමනා මත අර්ධ කාලීනව පත්කර තිබුණි. | සුදුසුකම් ලත් නිළධාරියෙකු ස්ථිර තනතුරුට පත්කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉංජිනේරු නිළධාරියෙකුගේ සහය ලබාගැනීම යන අරමුණින් 107 වන පාලක සභාවේ අනුමැතියෙන් (ඌව පළාත් ආණ්ඩුකාරවරයගේ ද අනුමැතියෙන්) එම්.ජේ.ටී. ගංගානන්ද මහතා 2015.12.02 දින සිට රු.50,000 ක දීමනාවකට අර්ධකාලීනව පත් කරන ලදී. |

| | | |
|---|---|---|
| | | 2017 වර්ෂයේ ව්‍යාපෘති ඉංජිනේරු නව තනතුර අනුමත වීමත් සමඟ එම තනතුර පිරවීම සඳහා 2017 ඔක්තෝබර් මස අයදුම්පත් කැඳවීම සිදුකර නමුත් සුදුසුකම් ලත් අයදුම්පත් නොලැබීම හේතුවෙන් එකී පුරප්පාඩු පිරවීම සිදුකරන තෙක් අදාල අනුමත තනතුරෙහි වේතන ඉතුරුම් මගින් ගෙවීම් කරන පදනමින් ඒ.එම්.ජේ.ටී. ගංගානන්ද මහතාගේ සේවය තවදුරටත් ලබාගැනීමට පාලක සභාව තීරණය කර ඇත. |
| (iv) | විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂයට පෙර ට්‍රැක්ටර් 02 ක් ද 2017 වර්ෂය තුල බස්රථ 03 ක් ද මිල දී ගෙන තිබුණු නමුත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ස්ථිර රියදුරන් බඳවා ගැනීමට කටයුතු නොකර විශ්වවිද්‍යාලයේ ශ්‍රම සැපයුම් වැඩසටහන යටතේ දෛනික දීමනා මත පුද්ගලයන් හතර දෙනෙකු රියදුරන් ලෙස බඳවා ගෙන තිබුණි. | 2017 වසරේ සිට අනුමත වූ කාර්ය මණ්ඩල තනතුරු අතර, රියදුරු තනතුර නොතිබූ අතර, නව කාර්ය මණ්ඩල තනතුරු අනුමත කරවා ගැනීම සඳහා 2017 අගෝස්තු මස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් අමතා යවන ලද ලිපියෙහි ස්ථිර රියදුරන් 05 දෙනෙකු සඳහා අනුමැතිය ඉල්ලා යවා ඇත. |

## 5 තිරසාර සංවර්ධනය

| 5.1 | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම. | |
|---|---|---|
| | **විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය** | **විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම** |
| | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "2030 න්‍යාප පත්‍රය" ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුනද තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම හා තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගැනීම සිදුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලය මඟින් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගනිමින් ඊට අනුරූප වන ප්‍රතිපත්ති සැකැස්මෙහි මූලික අධ්‍යයනයන්හි වර්තමානයේ නියැලෙමින් සිටී.<br><br>තවද, විශ්වවිද්‍යාලය විසින් නිශ්චිත වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලෙස නිශ්චිතව සඳහන් නොකළද විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්මෙහි හා සංයුක්ත සැලැස්මෙහි මෙකී ඉලක්කයන් 04, 05, 06 හා 09 යන ඉලක්කයන් යටතේ ආවරණය වන පරිදි සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබේ. |

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලස්ම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය හා ඊට පෙර ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.114,811,098 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 72 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට හෝ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණු අතර ඉන් රු.87,184,465 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 46 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිමකර නොතිබුණි. | 2017 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ට අනුව ප්‍රාග්ධන භාණ්ඩ අත්පත් කර ගැනීම් ඉදිකිරීම් හා සේවා සඳහා ප්‍රසම්පාදන සැලසුම් සකස් කොට පාලක සභාව වෙත ඉදිරිපත් කොට ඇති අතර විශ්වවිද්‍යාල කටයුතු සිදුකරගෙන යාමේදී ඇතිවන ප්‍රමුඛතා කාර්යන් සහ අතිරේක ප්‍රතිපාදන ලැබීම් හේතුකොට ගෙන එම සැලැස්ම අවස්ථා දෙකකදී සංශෝධනය කොට ඇත. ඒ අනුව 2017 අගෝස්තු 25 වන දින පැවති පාලක සභා රැස්වීම් අංක 124.12.24 යටතේ සංශෝධනය ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය දී ඇත. එසේම, 2017 දෙසැම්බර් 22 දින පැවති 51 වැනි මූල්‍ය කමිටුවේ අංක 51.24 යටතේ භාණ්ඩ සඳහා වන සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුමැතිය සඳහා නිර්දේශ කරන ලද අතර එම නිර්දේශ 130 වැනි පාලක සභාවේ අංක C/130/07/01 යටතේ අනුමැතිය ලබා දී ඇත.<br><br>ඔබගේ විගණන විමසුවේ ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව සිදුකරන ලද බව සඳහන් පහත සඳහන් ප්‍රසම්පාදන කටයුතු භාණ්ඩ සඳහා වන සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කොට ඇති බව දන්වමි.<br><br>එසේම, ඉහත සඳහන් කල භාණ්ඩාගාර ප්‍රතිපාදනයන්ට අතිරේකව අයවැය යෝජනා යටතේ තාක්ෂණික විෂය ධාරාව සඳහා දෙන ලද අතිරේක ප්‍රතිපාදන යටතේ මිලදී ගනු ලබන භාණ්ඩ හා ඉදිකිරීම් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කොට නොමැති අතර එම මිලදී ගැනීම් හා ඉදිකිරීම් සියල්ල අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කොට අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ක්‍රියාත්මක කොට ඇත. |

| | | |
|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල නිමකිරීමට සැලසුම් කර තිබුණු රු.505,000,000 ක් වටිනා ප්‍රසම්පාදන 134 කින් රු.163,506,415 ක් වටිනා ප්‍රසම්පාදන 39 ක් නිමකර නොතිබුණි. | ප්‍රමුඛතාවයන් වෙනස්වීම හේතුකොට ගෙන සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කටයුතු සියල්ලටම සැලසුම් කරන ආකාරයේ නිම කිරීමට නොහැකි වුවද 2017 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සහ පුනරාවර්ථන හා වැඩි දියුණු කිරීම් සඳහා වෙන් කරන ලද ඇස්තමේන්තු මුදලින් 87% ක මුදලක් වැය කොට ඇති බව දන්වමි. ( 2017 වාර්ෂික ගිණුම් වාර්ථාවේ පිටු අංක 50ට අනුව) |

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | නේවාසිකාගාර සහ කාර්යමණ්ඩල සඳහා නිවාස 75 ක් කුලියට ලබා ගැනීම වෙනුවෙන් 2016 සැප්තැම්බර් 12 දින ප්‍රසිද්ධ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමේ කොන්දේසි 2.6 ප්‍රකාරව රජයේ ඇස්තමේන්තු තක්සේරු කුලිය හා ඉදිරිපත් වන කුලිය සලකා බලා ගෙවිය යුතු කුලිය තීරණය කල යුතු වුවත් කුලියට ලබාගත් නිවාස 13 ක් සඳහා රජයේ තක්සේරු කුලියට වඩා මාසිකව රු.112,100 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද රජයේ ඇස්තමේන්තු තක්සේරු කුලිය ලබා නොගෙන නිවාස 12 ක් වෙනුවෙන් මාසික කුලිය රු.775,070 ක් ගෙවා තිබුණි. | නිවාස අයදුම්පත් ලබාගත් පසු රජයේ තක්සේරුව හා නිවාස කුලිය පිළිබඳ එකඟතාවයට සභාපති ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ඇගැයීම් කමිටුව විසින් සාකච්ඡා කර අවසන් එකඟතාවය මත මාසික කුලිය තීරණය කොට ඇත.<br><br>ඉහත තක්සේරු මුදල හා නිවාස කුලී වෙනස යොදනු ලබන ලමුන් සංඛ්‍යාව, ප්‍රධාන මාර්ගයට ඇති දුර, ප්‍රවාහන පහසුකම් යන කරුණු මත විශ්වවිද්‍යාලයේ හා ළමුන්ගේ පහසුව සලකා ඇගැයීම් කමිටුවේ නිර්දේශය මත හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත එම නිවාස ලබාගන්නා ලදී. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව මාසික කුලී වටිනාකම රු.681,282 ක් වන නිවාස 15 ක් 2017 වර්ෂයේ අවස්ථා කිහිපයක දී නේවාසිකාගාර ලෙස මාසික කුලිය රු.47,000 ක් හා රු.27,500 ක් බැගින් නිවාස 02 ක් සංචාරක නිවාස වෙනුවෙන් වසරක කාලයක් සඳහා කුලියට ලබාගෙන තිබුණි. | ටෙන්ඩර් පුවත් පත් දැන්වීමට අනුව ලැබුණු මිල ගණන් මඟින් ලැබුණු නිවාස ප්‍රමාණවත් නොවූ බැවින්, නැවත නිවාස ලබා ගැනීමට අයදුම්පත් ලබාගන්නා ලදී. එසේ අයදුම්පත ලබා ගැනීමට සිදුවූයේ නැවත පුවත් පත් දැන්වීමක් පළකර ටෙන්ඩර් පටිපාටියට යෑමට දීර්ඝ කාලයක් වැයවන බැවින් ශිෂ්‍ය නේවාසිකාගාර සොයා ගැනිම සඳහා කඩිනම් පියවරක් වශයෙනි, එසේ ලබාගත් අයදුම්පත් තාක්ෂණික අගැයීම් කමිටුවේ නිර්දේශ මත හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අවශ්‍ය නිවාස සංඛ්‍යාව ලබාගන්නා ලදී. තාක්ෂණික ඇගැයීම් කමිටුවේ නිර්දේශ යූඩබ්ලිව්යූ/ජීඒ/05/එච්/2017 ලිපිගොනුවේ පිටු අංක 58 හා 59 ප්‍රසම්පාදන කමිටුවේ 992/2017 (අංක 60 හි සඳහන් වේ)<br><br>2007 වර්ෂයේ සිටම විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය සඳහා කොළඹ සම්බන්ධීකරණ කටයුතු සඳහා භාවිතා කරන කාර්යාලයක් සඳහාද, ළමුන්ගේ නවාතැන් සඳහා එක් නිවාසයක්ද කොළඹ ප්‍රදේශයෙන් ටෙන්ඩර් පටිපාටියට අනුව කුලියට ලබාගෙන තිබුණි. කෙසේ නමුත් සංචාරක නිවාස සඳහා පුවත්පත් දැන්වීමේ සඳහන් නොකළ බව පිළිගන්නා අතර ඉදිරියේදී එය ඇතුලත් කර මිල ගණන් කැඳවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | නේවාසිකාගාර හා නිල නිවාස සඳහා නිවාස තෝරාගැනීමේ දී එම නිවාසවලට අදාල අනුකූලතා සහතික පිළිබඳ අවධානය යොමු කර නොතිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම සඳහා යොදාගත් නිවාස වල ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නේවාසිකාගාර තේරීම සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවට වැඩ ඉංජිනේරු, නේවාසිකාගාර පාලක, විශ්වවිද්‍යාලයේ වෛද්‍යතුමිය හා ශිෂ්‍ය සුභ සාධන අංශයේ ප්‍රධානියා ඇතුළු නිලධාරීන් සමන්විත විය. ඔවුන්ගේ අනුකූලතා මත නේවාසිකාගාර තෝරාගන්නා ලදී. |

| | | |
|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාලයට එකක් රු.5,400,000 බැගින් රු.10,800,000 ක් ගෙවා බස් රථ දෙකක් 2017 දෙසැම්බර් 07 දින පෞද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br>(i) ප්‍රසම්පාදනය සදහා පිළියෙල කර පිරිවිතර ප්‍රකාරව 2017 වර්ෂයේ නිෂ්පාදිත බස් රථ මිලදී ගත යුතු වුවත් 2016 වර්ෂයේ නිෂ්පාදිත බස් රථ 2 ක් මිලදීගෙන තිබුණි.<br>(ii) මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය පරිදි කඳු සහිත මාර්ග පද්ධතියට වඩාත් යෝග්‍ය ඇලුමිනියම් බඳ සහිත ආසන 58 ගියර් 06 ඇලුමිනියම් තට්ටුව සහිත බස් රථ කෙරෙහි අවධානය යොමුකිරීම වෙනුවට ෆයිබර් මිශ්‍රිත බඳ සහිත බස් රථ කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණි. | විශ්වවිද්‍යාලය විසින් මිලදි ගෙන ඇති ලියපදිංචි අංක UP/ND – 1584 දරණ බස් රථය සඳහා මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් තුමා විසින් 2017/11/30 දිනැති අංක LOT F10 985375 දරණ ලියාපදිංචි සහතිකයේ අනු අංක 19ට අනුව නිෂ්පාදිත වර්ෂය 2017 ලෙස පැහැදිලිව දක්වා ඇත. එමෙන්ම ලියාපදිංචි අංක UP/ND – 1582 දරණ බස් රථය සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2017/11/30 දිනැති අංක LOTF10985377 දරණ ලියපදිංචි සහතිකය අනු අංක 19ට අනුව නිෂ්පාදිත වර්ෂය 2017 ලෙස දක්වා ඇත. ඒ අනුව ඔබ විසින් 2016 වර්ෂය නිෂ්පාදිත බස් රථ මිලදි ගෙන ඇතිබවට කරන ලද නිරීක්ෂණයන් සමඟ එකඟ නොවන බව දන්වමි.<br><br>නමුත් විගණන විමසුමෙ සදහන් වන පරිදි වාහන ලියාපදිචි කිරීමෙ සහතිකයේ සදහන් නිෂ්පාදිත වර්ෂය සහ බස්රථයේ චැසි (Chassie) අංකයට අනුව නිෂ්පාදිත වර්ෂය නොසැසඳීම ගැටළු සහගත බැවින්, ඒ සම්බන්ධයෙන් මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙතින් ලිඛිත තහවරුක් ලබාගැනීමට කටයුතු කොට ඇත.<br>බස් රථය මිලදී ගැනීමේදී ෆයිබර් මිශ්‍රිත බඳ සහිත බස් රථ කෙරෙහි පමණක් අවධානය යොමු නොකල අතර පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කොට ඇති බව දන්වමි.<br><br>1. පිරිවිතරයන්ට අනුකුල විම.<br>2. එන්ජින් ධාරිතාව<br>3. ආසන සංඛ්‍යාව<br>4. ආසන සැලැස්ම<br>5. වැයවන ඉන්ධන ප්‍රමාණය<br>6. කඳු සහිත මාර්ග පද්ධතිය සඳහා වඩා යෝග්‍ය විම<br><br>බස්රථ මිලදි ගැනිමේදි විශ්වවිද්‍යාලය වඩාත් වාසිදායක වන අන්දමට ඉහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන අදාල මිලදි ගැනිම සිදුකර ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඉ) | කාර්යමණ්ඩල නිල නිවාස සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2016 ඔක්තෝබර් 14 දින ආරම්භකර මිල ගණන් කැඳවා තිබුන ද නියමිත කාල වකවානුව තුල තාක්ෂණික ඇගයම් කමිටුව ක්‍රියාත්මක නොකිරී නිසා සමාලෝචිත වර්ෂයේ දී ගෘහභාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.589,500 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | ඉහත මිල දී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල සීමාව තුල නිම කිරිමට නොහැකි වීම සඳහා පහත සඳහන් හේතු බලපෑ බව දන්වමි.<br><br>ඉහත සඳහන් ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට අදාල ටෙන්ඩරයේ තාක්ෂණික ඇගයීම් කමිටු සභාපති ලෙස මහාචාර්ය සිසිර එදිරිවීර මහතා 2017/01/23 දින පත්කොට ඇති අතර, පසුව ඒ මහතා වෙනත් රාජකාරී කටයුතු කිහිපයක නිරත වීම හේතු කොට ගෙන වෙනත් සභාපතිවරයෙකු ඒ සඳහා පත් කරන ලෙස යෝජනා කරනු ලැබූ අතර, ඒ අනුව විද්‍යා හා තාක්ෂණික පීඨයේ ආචාර්ය එන්.ජී. ප්‍රේමචන්ද්‍ර මහතා තාක්ෂණික ඇගයීම් කමිටු සභාපති ලෙස 2017/03/14 දින පත් කොට ඇත.<br><br>අදාල කාලසීමාව තුල තාක්ෂණික විෂය ධාරාව ආරම්භ කිරිමට අදාල මිලදී ගැනිම ඇතුළුව මිලදී ගැනිම් ලිපිගොනු වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කල අතර තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා පලපුරුදු සාමාජිකයන් සීමිත ප්‍රමාණයක් පමණක් විශ්වවිද්‍යාලයේ සිටි බැවින් ඔවුන් විවිධ කාර්යන්හි නියැලීම හේතු කොට ගෙන තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා ඔවුන්ගේ සේවය ලබා ගැනිමේ ප්‍රමාදයන් සිදු වී ඇත. ජ්‍යෙෂ්ඨ නිලධාරි නිල නිවාස සහ තනිකඩ නිල නිවාස සඳහා අවශ්‍ය ලී බඩු මිලදී ගැනිම සඳහා මෙම ටෙන්ඩරය ක්‍රියාත්මක කරණ ලද අතර පසුව ජ්‍යෙෂ්ඨ නිලනිවාස සඳහා අවශ්‍ය ලී බඩු සඳහා විෂය පථය වෙනස්විම හේතු කොට ගෙන මෙම ටෙන්ඩරය යටතේ මිලදි ගනු ලැබුවේ තනිකඩ නිවාස සඳහා අවශ්‍ය ලිබඩු පමණි. අදාල තීරණය ක්‍රියාත්මක කිරිමේදී ද යම් ප්‍රමාදයන් සිදුවි ඇති බව දන්වමි. |
| (ඊ) | 2006 වර්ෂයේ විශ්වවිද්‍යාලය පිහිටුවීමේ පළමු වන අදියර යටතේ රු. මිලියන 350 ක් වටිනා ගොඩනැගිලි ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0536/035 හා 2005 අප්‍රේල් 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉටු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට තෝරාගෙන තිබුණි.<br>මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කෙරේ.<br>(i) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2005 අප්‍රේල් මස CECB ආයතනය වෙත ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කිරිමේ නිවේදනය නිකුත් කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව (STEC) නිර්දේශ හා උපදෙස් වලට අනුකූලව ඉදිකිරීම් කටයුතු පරිපාලනය කොට ගෙවීම් කටයුතු සිදුකොට ඇත. |

| | | |
|---|---|---|
| | ගිවිසුමකට එළඹීමකින් තොරව නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉදිකිරීම් සිදුකිරීම සඳහා 2005 ජූනි 09 වන දින සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 05 කදී රු.138,217,390 ක අත්තිකාරම් මුදලක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | |
| | (ii) 2006 අගෝස්තු 21 වන දින විශ්වවිද්‍යාලය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමග නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට ඉදිකිරීම් සිදුකිරීම සඳහා මුළු වැඩ වටිනාකම රු.284,273,405 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුමට එළඹීමට පෙර 2006 පෙබරවාරි 06 වන දින සිට 2006 මැයි 31 වන දින දක්වා අවස්ථා 05 කදී රු.84,890,797 ක් විශ්වවිද්‍යාලය මගින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණි. එසේ වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයට ඉහත කොන්ත්‍රාත්තුවේ පරිපාලන කටයුතු පැවරීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වර්ෂ 2006 තුලදීම විශ්වවිද්‍යාල සිසුන් බඳවා ගැනීම සඳහා එවක පාලක රජය මගින් ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ඉදිකිරිම් කටයුතු සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා වලට අනුව ඉදිකිරිම් කටයුතු සැලසුම් කිරිම මාස 02 ක් තුලද, මුල් අදියරේ ඉදිකිරිම් කටයුතු මාස 08ක් තුලද, නිමකිරිමටත් තීරණය කර තිබුණි. එම ඉලක්ක ලගා කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වන CECB ආයතනය වෙත කොටස් මුදල් රුපියල් 84,490,793.00 නිදහස් කිරීම විශ්ව විද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදුකර ඇත.<br>ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ඉදිකිරිම් කටයුතු අධීක්ෂණය සඳහා බලතල පවරන ලද කමිටුවක් මගින් සිදුකරන ලදී. එසේම විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය පත්කල පසුව සිදු කල ඉදිකිරිම් කටයුතු ඔවුන් විසින් අධීක්ෂණය කරන ලදී. |
| | (iii) මෙම ඉදිකිරීම සඳහා 2005 අප්‍රේල් 21 දිනැති 05/0536/035 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිර්මාණය කර ඉදිකිරීම් ක්‍රමයට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වී තිබිය දී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද CIDA/SBD/04 න් 14.1 (ආ) වගන්තිය පරිදි මිල ගැලපුම් කිරීම සඳහා ගෙවීම් නොකළ යුතු වුවද ඊට පටහැනි ලෙස මිල විචලනයන් ලෙස රු.28,427,341 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි. | පළමු අදියරේ ඉදිකිරිම් සඳහා ගිවිසුමේ කොන්ත්‍රාත් කොන්දේසි අනු අංක 13.07 යටතේ මිල විචලනයන් සඳහා ගෙවීම් සිදුකර ඇත. ගෙවීම් සඳහා මුලු විචලනය රුපියල් මිලියන 33.4 ලෙස ඉදිරිපත් වූ අතර විචලනයන් ගෙවිමේ උපරිම සීමාව කොන්ත්‍රාත් මුදලින් 10% වන බැවින් එම සීමාව සලකා බලා රුපියල් මිලියන 28,424,341.00 වන ගෙවීම මිල විචලනයන්ට අනුකූලව ගෙවා ඇත. |
| | (iv) කොන්ත්‍රාත්කාර සමාගමෙන් ප්‍රමාද දඩ වශයෙන් රු.2,250,000 ක් අයකර ගෙන තිබුණ ද ගණනය කිරීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පළමු අදියරේ ඉදිකිරිම් සඳහා වූ ගිවිසුමේ කොන්ත්‍රාත් කොන්දේසි අනු අංක 8.7 යටතේ එක් එක් ඉදිකිරිම් සඳහා වූ දඩ මුදල් ලෙස දිනකට රුපියල් 15,000.00 ක් ලෙස අයකල යුතුය. දින 150 ක් සඳහා රුපියල් 2,250,000.00 ලෙස ගණනය කර අයකර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| | (v) 2006 අගෝස්තු 21 වන දින විශ්වවිද්‍යාලය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමග එළඹුණු ගිවිසුම අනුව වැඩ කොටස් 05 ක් සඳහා රු.284,273,405 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණ ද 2015 නොවැම්බර් 16 වන දින අවසාන ගෙවීම් වාර්තාවේ වැඩ කොටස් 06 ක් ඇතුලත් කර ගිවිසුම්ගත නොවූ වැඩ කොටස් සඳහා රු.44,123,115 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | මෙම වැඩකොටස් ගිවිසුමේ අවිනිශ්චිත වියදම් හා මුල් ගිවිසුමෙන් වූ ඉතුරුම් සළකා බලා අනුමත කරන ලද වැඩ කොටස් වේ. සියලුම ගෙවීම් කොන්ත්‍රාත් මුදල ප්‍රකාරව සිදුකර ඇත. |

### 6.3 අයවැය පාලනය

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සදහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සමඟ සැසැඳීමේ දී අය විෂයන් 4 ක සියයට 15 සිට සියයට 151 දක්වා සැලකිය විචලනයක් නිරීක්ෂණය වූ අතර, ඇස්තමේන්තුගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසැඳීමේ දී වැය විෂයයන් 13 ක සියයට 20 සිට 119 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එසේම ප්‍රග්ධන වියදම් යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද වියදම අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ දී සංශෝධිත අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලස්වා තිබුණු පුනරාවර්තන ආදායම් ලැබීමේ ප්‍රතිශතය සියයට (15) සිට සියයට 151 දක්වා වෙනස් වී තිබුණි. අපේක්ෂිත වෙනත් ආදායම් ඉලක්ක ඉක්මවීම හේතු කොට ගෙන මෙම වෙනස් වීම සිදු වී ඇති අතර, එය යහපත් විචලනයක් බව දන්වමි.<br><br>අනුමත ප්‍රග්ධන ප්‍රදාන රු.400,000,000 ක් භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කලද මුදල් නිදහස් කරන ලද්දේ රු.322,914,000 ක් පමණි. ලැබූ ප්‍රග්ධන ප්‍රතිපාදන සියල්ල අනුමත කාර්යයන සඳහා යොදවා ඇති බව දන්වමි.මෙය ඇස්තමේන්තුගත මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 81% කි.<br><br>ප්‍රාග්ධන වියදම් යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද රු.457,430 ක වියදම ප්‍රාග්ධන වියදම් අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී හඳුනාගෙන නොතිබුණ අතර, එය නිවැරදි කිරීමට කටයුතු කරමි.<br><br>සංශෝධිත අයවැය ප්‍රතිපාදන අනුව රු.658,352,000 ක් පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු කර තිබුණු අතර තථ්‍ය වියදම රු.627,869,532 ක් වූයෙන් රු.30,482,468 ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 05 ක් විය. වැය විෂයයන් 02 ක් සඳහා සලස්වා තිබුණු ප්‍රතිපාදන මුදලට වඩා වැඩිපුර වියදම් කර තිබුණි. එයට හේතු වූයේ නේවාසිකාගාර තුල වූ CFL බල්බ් |

| | | |
|---|---|---|
| | | යොදා විදුලි වියදම් අඩු කිරීමට කටයුතු කල අතර ඒ සඳහා බල්බ මිල දී ගැනීම ඇතුළු අනෙකුත් නඩත්තු වියදම් වැඩි වීම හේතු කොට ගෙන අපේක්ෂිත නඩත්තු වියදම් ඉක්මවා ඇත.<br><br>උපදේශණ සේවා සැපයීමේ දී සැලසුම් කරන ලද උපදේශන සේවා ඉලක්ක ඉක්මවීම හේතු කොටගෙන එම සේවාවන් සැපයීමට අදාල වියදම් ඉක්මවීම මත මෙම වෙනසට හේතු වී ඇත.<br><br>අපේක්ෂිත ප්‍රග්ධන වියදම් සියල්ල සම්පූර්ණ කිරීමට නොහැකි වුවද මුළු ප්‍රග්ධන ඇස්තමේන්තුවෙන් 93% වැය කොට ඇත.<br><br>තාක්ෂණ විෂය ධාරාවට අදාලව අයවැය යෝජනා අනුව 2016 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 2017 වර්ෂයේ සම්පූර්ණ කිරීම හේතුවෙන් 2017 වර්ෂයේ සත්‍ය වියදම වැඩි වී ඇත.<br>තාක්ෂණික විෂය ධාරාවට අදාලව සකස් කරන ලද අනුමත ක්‍රියාකාරී සැලස්මට අනුව ඉහත ව්‍යාපෘතිය සිදු කල අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අදාල මුදල් නිදහස් කර ඇති බව දන්වමි. |

### 6.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

| | විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණය | විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවන කොටස ප්‍රකාරව අපද්‍රව්‍ය මෝචනය හෝ බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන ඊට අදාල සිදුකල යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර වල භාවිතා කර ඉවත් කරනු ලබන රසායන ද්‍රව්‍ය බැහැර කිරීම් සඳහා එවැනි බලපත්‍රයක් ලබා ගෙන ඊට අනුකූලව කටයුතු කිරීම වෙනුවට විශ්වවිද්‍යාල භූමියේ සකස් කරන ලද වලකට ජලය සමග මිශ්‍ර කර බැහැර කර තිබුණි. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර වලින් බැහැර කරන අපද්‍රව්‍යයන් පරිසරයට බැහැර කරනු නොලැබේ. එහිදි රසායන ද්‍රව්‍ය හා අනෙකුත් පරිසරයට අහිතකර ද්‍රව්‍ය බහාලුන් තුලට එකතු කරනු ලබයි. ඒ අනුව ඒවා පරිසරයට මුසුවීම සිදුනොවේ.<br><br>තවදුරටත් විශේෂිත නොවන රසායන ද්‍රව්‍ය සම්පූර්ණයෙන් සිමෙන්ති වලින් ආවරණය කරන ලද බාහලුමකට යොමුකරනු ලබයි. |

| | | |
|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂ 03 ක ජල පරිභෝජනය වෙනුවෙන් රු.13,537,151 ක වියදමක් දරා තිබුණි. විශ්වවිද්‍යාලයේ විවිධ අංශ විසින් බැහැර කරන අපවිත්‍ර ජලය, අපජල පිරිපහදු පද්ධතිය මගින් පිරිසිදු කර බැහැර කිරීම සිදු කර තිබුනද මෙම ජලය වාහන සේදීමට හා වෙනත් නඩත්තු කටයුතු සඳහා යොදා ගෙන ජලය සඳහා වැයවන පිරිවැය අඩුකර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | වසර 2006 සිට මේ වන තෙක් විශ්වවිද්‍යාලයේ කටයුතු වෙනුවෙන් භාවිතා වන ජලය( විද්‍යාගාර වල හැර) හා ජල පිරිපහදුවෙන් පිටවන අප ජලය පරිසරයට මුදාහරී. මෙහිදි පිරිපහදුවෙන් පිටවන ජලයත් භූමියේ වූ උල්පත් ජලයත් හා වැසි ජලයත් යන සියලු මූලාශ්‍රවලින් ලැබෙන ජලය නැවත භාවිතා කිරිම සඳහා වූ අමතර ජල සැපයුම් ව්‍යාපෘතිය වසර 2017 හි සිදුකිරිම සඳහා අවශ්‍යය පිරිවැය හා අනුමැතිය ලබා ගෙන ඇත. එය මේ වන විට අධීක්ෂණ මට්ටමේ ඇති අතර ලබන වසර මුල් කාර්තුව තුළ නිමකිරිමට නියමිතය. |

## 07 පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණය අඩුපාඩු හා නොසැසඳු ගිණුම් පැවතීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම, ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) | ගබඩා පාලනය | දුර්වල තොග කළමනාකරණය |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම. |

ආචාර්ය ජේ.එල් රත්නසේකර
උපකුලපති

ආචාර්ය ජේ.එල්. රත්නසේකර
උපකුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
පස්සර පාර, බදුල්ල